

# පුහුණු මොඩියුලය

**තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය, නීති සහ ප්‍රතිචාර යාන්ත්‍රණ**

Centre for Equality and Justice

CitW

© සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ), ශ්‍රී ලංකාව.
සියලුම හිමිකම් ඇවිරිණි.

නිර්මාණය සහ පිරිසැලසුම: Know Us Art (Pvt) Ltd

මුද්‍රණය හා ප්‍රකාශනය: පෙබරවාරි 2023

කතු හිමිකම ඇවිරෙන පරදි මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් ප්‍රතිනිෂ්පාදනය, ගබඩා කිරීම හා විද්‍යුත්, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම හෝ වෙනත් ආකාරයකින් බෙදාහැරීම සපුරා තහනම්.

වැඩි විස්තර සඳහා:
සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය
37/2, එලිබෑන්ක් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව
දු.ක./ෆැක්ස්: +94 11 2055404
විද්‍යුත් තැපෑල: srilanka.cej@gmail.com

ISBN 978-624-5847-27-3

# කෙටි යෙදුම් ලැයිස්තුව

| | |
|---|---|
| CEDAW | ස්ත්‍රීන්ට එරෙහිව කෙරෙන වෙනස්කම් පිටුදැකීම පිළිබඳ කමිටුව<br>Committee on the Elimination of Discrimination Against Women |
| CCID | පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය Computer Crimes Investigation Division |
| CCU | සයිබර් අපරාධ ඒකකය Cyber Crimes Unit |
| CID | අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව Criminal Investigation Department |
| TFSGBV | තාක්ෂණය සමඟ බැඳී ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය<br>Technology Facilitated Sexual and Gender-Based Violence |
| DIG | නියෝජ්‍ය පොලිස්පති Deputy Inspector General |
| GBV | සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය Gender-Based Violence |
| GOHS | සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය Gendered Online Hate Speech |
| IASC | අන්තර් නියෝජිතායතන ස්ථාවර කමිටුව Inter-Agency Standing Committee |
| IBSA | පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය Image-Based Sexual Abuse |
| LGBTQI+ | සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුචියර) සහ අන්තර්ලිංගික Lesbian, Gay, Bisexual, Transgender, Queer and Intersex |
| MLA | අන්‍යෝන්‍ය නීති ආධාර Mutual Legal Assistance |
| NCII | අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප Image-Based Sexual Abuse |
| NCPA | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය National Child Protection Authority |
| SGBV | ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය Sexual Gender-Based Violence |
| SLCERT | ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය<br>Sri Lanka Computer Emergency Readiness Team |
| SLMA | ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය Sri Lanka Medical Association |
| SOGIESC | ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ<br>Sexual Orientation, Gender Identity, Gender Expression and Sex Characteristics |
| UN | එක්සත් ජාතීන් United Nations |
| UNFPA | එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල United Nations Populaiton Fund |
| WHO | ලෝක සෞඛ්‍ය සංවිධානය World Health Organization |
| WIN | කාන්තා පිහිට Women In Need |

# පටුන


1 හැඳින්වීම 6

2 පසුබිම 6

2.1 සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) සහ ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) යනු කුමක්ද? 7

2.2 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) යනු කුමක්ද? 9

2.3 සමාජභාවීකරණය වූ ඔන්ලයින් (මාර්ගගත) වෛරී කථනය (GOHS) යනු කුමක්ද? 10

2.4 ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) හි ව්‍යාප්තිය සහ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නිවේශනය 12

2.5 මානව හිමිකම් උල්ලංඝනයන 15

3 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි ආකාර/ ප්‍රභේද 16

3.1 අනුමැතියෙන් තොර සමීප සබඳතා පින්තූර බෙදා හැරීම (Non-Consensual Intimate Image (NCII) Sharing) සහ පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය (Image-Based Sexual Abuse (IBSA) හෙවත් සුලබ ලෙස පවසන පරිදි 'පළිගැනීම සඳහා කාමුක දර්ශන යොදාගැනීම' (Revenge Pornography) 16

3.2 මෝෆින් (Morphing) - වෙනස් කළ ඡායාරූප/ වීඩියෝ 17

3.3 ඩොක්සින් (Doxxing) 17

3.4 ලිංගිකමය ත්‍රාසද්ග්‍රහණය (Sextortion) 18

3.5 ව්‍යාජ පැතිකඩ (Fake Profiles) සහ පුද්ගලානුරූඩය (Impersonation) 19

4 මොඩියුලයේ අරමුණු 20

4.1 ප්‍රධාන නිරීක්ෂණ 21
4.2 ශාස්ත්‍රීය පර්යේෂණය 21
4.3 ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGDs) 22
4.3.1 FGD 1 - මහජන ආයතන 23
4.3.2 FGD 2 - සිවිල් සමාජය 27

5 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා වන ප්‍රතිචාර යාන්ත්‍රණ 30

5.1 පසුබිම 30
5.2 ද්වී කොටස් එළඹුම/ ප්‍රවේශය (Two-part approach) 30
5.3 ෆේස්බුක්, ඉන්ස්ටග්‍රෑම් සහ යූ ටියුබ් සමාජජාල වේදිකාවන් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්ගෙන් (TFSGBV) වලින් ආරක්ෂිත කිරීම පිණිස පවතින වාර්තා කිරීමේ මෙවලම් (reporting tools) සලකා බලමු. 31

5.3.1 ෆේස්බුක් - Facebook 31
5.3.2 ඉන්ස්ටග්‍රෑම් - Instagram 33
5.3.3 යූ ටියුබ් - YouTube 34

6 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා වන ආරක්ෂණ යාන්ත්‍රණ 35

6.1 උන්මොචන් (Unmochon) - බංග්ලාදේශය 35

7 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි විවිධ ආකාරයන් හඳුනා ගන්නේ කෙසේද? 36

7.1 සිදුවීම්වල අවස්ථා පදනම් කරගෙනතාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හඳුනා ගැනීම 37

7.1.1 අනුමැතියෙන් තොරව සමීප සබඳතා පින්තූර බෙදා හැරීම (NCII) 37
7.1.2 වෙනස් කරන ලද ඡායාරූප (Doctored images) 37
7.1.3 ඩොක්සින් (Doxxing) 38
7.1.4 සෙක්ස්ටෝෂන් 38
7.1.5 ව්‍යාජ පැතිකඩ (Fake profiles) සහ පුද්ගලානුරූඩය (Impersonation) 39

8 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා ශ්‍රී ලංකාවේ නීති යාන්ත්‍රණයේ ප්‍රතිචාරය 39

8.1 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයයන් බලපවත්වන නීති 39
8.2 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) පිළිබඳ පරීක්ෂණ පවත්වන ආයතන සහ අන්තර් අධිකරණ විමර්ශන සඳහා පවතින මෙවලම් 43

8.2.1 පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) යනු කුමක්ද? 43
8.2.2 ප්‍රාදේශීය පොලිස් ස්ථාන වලට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) හි පැමිණිල භාර ගත හැකිද? 44
8.2.3 පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට ඉටු කිරීමට කාර්ය භාරයක් තිබේ ද? 44
8.2.4 විමර්ශන සඳහා ජාතයන්තර සහයයෝගීතාව ලබා ගන්නේ කෙසේද? 45
8.2.5 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සම්බන්ධයයන් විමර්ශනය කර පියවර ගත හැකි වෙනත් රාජ්‍ය ආයතන තිබේද? 46

8.3 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වින්දිතයින් පළමු ප්‍රතිචාර දක්වන්නන් ලෙස පිළිගැනීම සහ පොලිසියේ කාර්යභාරය පිළිබඳ මාර්ගෝපදේශ 46

8.3.1 සමාන ලෙස සැලකීම සහ අභිමානය ට ගරු කිරීම 47

8.3.2 ළමා වින්දිතයන්ගේ උපරිම යහපත සාක්ෂාත් කිරීම 47


8.3.3 පක්ෂග්‍රාහී නොවන්නට වින්දිතයා සහ වින්දිතයා ව තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත භාජනය කරවූ ක්‍රියාවන් විනිශ්චය නොකරන්න 48

8.3.4 සහකම්පනයෙන් යුක්ත වන්න 48

8.3.5 අපක්ෂපාතීව සහ කඩිනමින් විමර්ශනය කරන්නට අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ. 49

9 නිගමනය 50

10 පරිශීලන ලැයිස්තුව 51



# හැඳින්වීම

මෙම මොඩියුලය, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා ප්‍රතිචාර දැක්වීමේදී සංවිධාන සහ ආයතනවල ඩිජිටල් සාක්ෂරතාවය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය විසින් සිදුකළ මාස 4 ක පර්යේෂණ පරිශ්‍රමයක ප්‍රතිඵලය යි. මෙම මොඩියුලය යාවත්කාලීන කිරීම සඳහා සහ TFSGBV යන ගැටළුව පිළිබඳ නව කරුණු ඇතුළත් කිරීම සඳහා පසුකාලීන සංස්කරණයන් මෙහි සිදු කර ඇත.

## 2 පසුබිම: තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) අවබෝධ කර ගැනීම

පුළුල් වශයෙන් ගත් විට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) යනු වින්දිතයාගේ සමාජභාවය අවධාරණය කරමින් ඔන්ලයින් අවකාශයක සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වයේ ස්වරූපයක් වන අතර, සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) යනු විශේෂිත සමාජභාවයක් කෙරෙහි අගතිගාමීත්වයක් ලෙස විදහා දැක්වෙන වෛරී සහගත බව මත සිදුවන්නකි. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) යන දෙක ම, සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (GBV) යන පුළුල් කාණ්ඩයට ඇතුළත් වන සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයේ සංරචක ඇතුළත් වන ප්‍රචණ්ඩත්වයේ ස්රූපයන් වේ. මේ අනුව තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය(TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) අවබෝධ කර ගැනීමේදී අප විසින් මුලින් සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) සහ ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) අවබෝධ කර ගත යුතු වේ.

## 2.1 සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) සහ ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) යනු කුමක්ද?

ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) යනු, සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) ලෙස වටහාගත්, ප්‍රචණ්ඩත්වයේ විශාල වපසරිය තුළ තිබෙන කොටසකි. සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) යනු, විශේෂිත සමාජභාවයක් හෝ සමාජභාවී සුළුතරයක් කෙරෙහි යොමු වන විවිධාකාර ක්‍රියාවන් හරහා සිදුකරන ශාරීරික එනම් කායික සහ/හෝ මානසික (චිත්තවේගී) හානි වේ. දීර්ඝතම කාලයක් මානුෂීය කටයුතු සම්බන්ධීකරණයේ යෙදී සිටින එක්සත් ජාතීන්ගේ අන්තර් නියෝජිතායතන ස්ථාවර කමිටුව (IASC) විසින් සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) නිර්වචනය කරන්නේ පහත ආකාරයට ය.

"සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (GBV) යනු, යම් තැනැත්තෙකුගේ කැමැත්තට එරෙහිව සිදුකරන ඕනෑම හානිකර ක්‍රියාවක් වන අතර එය පුරුෂයන් සහ ස්ත්‍රීන් අතර පවතින සමාජය විසින් ආරෝපණය කරනු ලැබූ (එනම් සමාජභාවී) වෙනස්කම් මත පදනම් වෙයි"[1]

සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වයේ ආකාරවලට ලිංගික ප්‍රචණ්ඩත්වය ද ඇතුළත් වෙයි. ලිංගික ප්‍රචණ්ඩත්වය ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් 'ප්‍රචණ්ඩත්වය සහ සෞඛ්‍යය පිළිබඳ ලෝක වාර්තාව' (World Report on Violence and Health) හි සඳහන් කරන්නේ මේ ආකාරයට යඃ

"යම් තැනැත්තෙකු විසින් නිවසේ සිට සේවා ස්ථානය දක්වා ඕනෑම පසුබිමකදී, නමුත් එයට සීමා නොවී, වින්දිතයා සමග එම තැනැත්තාට තිබෙන සම්බන්ධතාවය කුමක් වුවත්, ලිංගික ක්‍රියාවක් ලබාගැනීමට උත්සාහ කිරීමක්, අනවශ්‍ය ලිංගිකමය අදහස් දැක්වීමක් හෝ ලිංගික වාසි ලබාගැනීමක් හෝ තැනැත්තෙකුගේ ලිංගිකත්වය ට වෙනත් ආකාරයකින් බලහත්කාරකමක් කිරීමක් සිදුකරන ඕනෑම ලිංගික ක්‍රියාවක් හෝ ක්‍රියාවන්"[2]

මේ අනුව ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) යනු, වින්දිතයා ට එරෙහිව වින්දිතයාගේ කැමැත්තකින් (අනුමැතියකින්) තොරව ලබාගත් හෝ ලබාගැනීමට උත්සාහ කළ, බලහත්කාරය යොදාගෙන සිදුකරන අනවශ්‍ය ලිංගික ක්‍රියාවක් වන අතර, මෙය සහමුලින්ම පදනම් වන්නේ හුදෙක්ම වින්දිතයාගේ ලිංගිකත්වය සහ/ හෝ සමාජභාවය පදනම් කර ගෙන ය. මෙකී ක්‍රියාවන්ට එකී වින්දිතයා අකමැති ලිංගිකමය ස්වභාවයේ මත ප්‍රකාශයන් ද ඇතුළත් ය. මෙහිදී බලහත්කාරයට බලය පාවිච්චි කිරීම, බ්ලැක්මේල් කිරීම, මනෝවිද්‍යාත්මකව බිය ගැන්වීම සහ කාර්යයක් ප්‍රතික්ෂේප කිරීම, කායික හානියක් සිදුකිරීම, පවුලේ සාමාජිකයන්ට හෝ සමීපතමයන් ට තුවාළ කිරීම යනාදී විවිධාකාර තර්ජනයන් ද ඇතුළත් ය.

---

[1] ජේන් වෝඩ් සහ ජුලී ලැෆ්රෙනියර්, Guidelines for Integrating Gender-Based Violence Interventions in Humanitarian Action: Reducing Risk," Promoting Resilience and Aiding Recovery' (අන්තර් නියෝජිතායතන ස්ථාවර කමිටුව 2015),

[2] එටියෙන් ජී. කෲග් යනාදීහු (සංස්.), World report on violence and health (ලෝක සෞඛ්‍ය සංවිධානය, 2002).

ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) පුද්ගලික සහ පොදු අවකාශය යන අවකාශයන් දෙකෙහිදී ම ඇතිවිය හැකි ය. තවද එය දන්නා තැනැත්තන් විසින් මෙන්ම නොදන්නා තැනැත්තන් විසින් ද සිදුකළ හැකි ය. ස්ත්‍රීන් ට එරෙහිව සිදුවන ප්‍රචණ්ඩත්වයන් වශයෙන් ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) පොදුවේ සැලකුවත් එය පුරුෂයන් ට සහ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) ප්‍රජාව ට එරෙහිව ද සිදු වේ. ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) බල අසමතුලිතතාවයක් හේතුවෙන් ඇති වේ. මෙහිදී වින්දිතයා බලය අඩු (හෝ ළමුන්, ස්ත්‍රීන්, සරණාගතයන් සහ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) ප්‍රජාවේ තැනැත්තන් සැලකූ විට බොහෝ විට බල රහිත) වටපිටාවක් තුළ සිදු වන අතර, අපරාධකරු හෝ ආක්‍රමණිකයා/ ප්‍රහාරක-යා හට වැඩි බලයක් තිබේ. පුරුෂාධිපත්‍යය සහ පුරුෂ මූලික පරම්පරා විසින් අර්ථ ගන්වන ලද සම්ප්‍රදායික සමාජභාවී සම්මතයන්, ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සඳහා නිධන්ගත හේතුව (මූල හේතුව) වශයෙන් හඳුනාගෙන තිබේ. පුරුෂාධිපත්‍යයේ ප්‍රතිඵලයක් වශයෙන් පුරුෂයන් විසින් භාරගන්නා බලයත්, ඉහළින් සිටීම පිළිබඳ හැඟීම සහ පුරුෂ මූලික සමාජභාවී භූමිකාවල වැඩරාමු තුළ පුරුෂයන් හට ලබා දී තිබෙන ඉහළ බව විසින් සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) දිරිමත් කිරීම සහ තීව්‍ර කිරීම සිදුකරනු ලබයි. වඩාත් බහුල ලෙස සිදුවන්නේ සම්ප්‍රදායික ලෙස හඳුනාගත් ස්ත්‍රී පුරුෂ භූමිකා සහ ලක්ෂණ, එම සමාජභාවී භූමිකා ප්‍රතික්ෂේප කරන හෝ එයට එරෙහි වන ජීව විද්‍යාත්මක ස්ත්‍රීන් සහ පුරුෂයන් මත ආරෝපණය කිරීමයි. තවද, ස්ත්‍රීන් සහ විවිධත්වයෙන් යුතු ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවයන්, සමාජභාවී ප්‍රකාශනයන් සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන් පාලනය කිරීමට හෝ ඔවුන්ට දඬුවම් කිරීමට මේවා යොදා ගැනීමයි. මෙහි ප්‍රතිඵලයක් ලෙසට ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) නිරන්තරයෙන් සිදුකරන්නේ පුරුෂයන් විසින් ස්ත්‍රීන්ට සහ විවිධත්වයෙන් යුතු ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන්ට එරෙහිව ය. කෙසේ නමුත්, පුරුෂමූලික සමාජභාවී සම්මතයන් චිරස්ථායී කිරීම සඳහා ස්ත්‍රීන් විසින් ලිංගිකමය හා සමාජභා-වය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සිදුකරන අවස්ථා ද තිබේ.[3] මේ අනුව ස්ත්‍රීන්, විවිධත්වයෙන් යුතු ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන් සහ සම්ප්‍රදායික සමාජභාවී සම්මතයන් ට අනුගත නොවන හෝ සම්ප්‍රදායික සම්මතයන් තුළට ගාල් කිරීමට අවශ්‍ය ව තිබෙන ස්ත්‍රී රූපී ශරීර ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) විසින් ඉලක්ක කරනු ලබයි.[4]

ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) වලට භාජනය වන ස්ත්‍රීන් සහ ගැහැණු ළමෝ මෙන්ම පුරුෂයන් සහ පිරිමි ළමෝ ද මනෝවිද්‍යාත්මක ගැටළු සහ මානසික ව්‍යාධිවලට තුඩු දෙන මානසික භ්‍රාන්තිය (trauma) ට ලක් වෙති. තවද ශරීරයට සහ ලිංගේන්ද්‍රියන් ට සිදුවන තුවාළ සහ HIV-AIDS හා ලිංගිකාශ්‍රිත රෝග (STD) වල අවදානමට ලක් වෙති. තවද අනවශ්‍ය ගැබ් ගැනීම් අවසන් කිරීම සඳහා සිදුකරන අනාරක්ෂිත ගබ්සාවන්, ගැබ්ගැනීමේදී ඇතිවන සංකූලතා (විශේෂයෙන්ම ළාබාල ගැහැණු ළමුන්) සහ ප්‍රජනන පද්ධතියට සිදුවන තුවාළවලට ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) වලට භාජනය වන ස්ත්‍රීන් සහ ගැහැණු ළමෝ ලක් වෙති. ලිංගික සෞඛ්‍යය ගැන සාකච්ඡාවන් තහංචි ලෙස සලකන සහ ජාතික සුව සේවා පද්ධතිය දුර්වල රටවල මෙම අවදානම් සාධක විසින් ජාතික සුව සේවා පද්ධතියට අතිරේක බරක් ද, වින්දිතයන්ට වඩාත් දරුණු අවදානමක් ද ඇති කරයි.

---

[3] ස්ත්‍රී චර්මඡේදනය (Female Genital Cutting -FGC) හෝ ස්ත්‍රී ජනනේන්ද්‍රිය ඡේදනය (Female Genital Mutilation -FGM) , පුරුෂ මූලික සමාජභාවී සංජානනයන් පවත්වාගෙන යාම සඳහා ස්ත්‍රීන් විසින් ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සිදුකිරීම සම්බන්ධයෙන් කදිම උදාහරණයකි.

[4] පුරුෂයන් සහ පිරිමි ළමුන් ද ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) වලින් ආරක්ෂිත නැති බව සඳහන් කළ යු ය. GBV පුරුෂයන් සහ පිරිමි ළමුන් අතර ද සිදුවන බව අන්තර් නියෝජිතායතන ස්ථාවර කමිටුව (IASC) විසින් හඳුනාගෙන තිබේ. පුරුෂයන් සහ පිරිමි ළමුන් ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ආකාරවල සමාජභාවී මානයන් ඉස්මතු කිරීම සඳහා ද 'සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය' යන යෙදුම ඇතැම් ක්‍රියාකාරිකයන් විසින් වැඩි වැඩියෙන් යොදාගනු බව පෙනේ. විශේෂයෙන් ම පිරිමි කම සහ ගැහැණුකම පිළිබඳ සමාජභාවීමය වශයෙන් අසමාන සම්මතයන් වෙර ගැන්වීමේ පැහැදිලිව පෙනෙන අරමුණෙන් යුතුව සිදුකරන ලිංගික ප්‍රචණ්ඩත්වයේ ඇතැම් ආකාරයන් (උදා- සන්නද්ධ අරගල තුළදී සිදුවන ලිංගික ප්‍රචණ්ඩත්වයේදී පුරුෂ ශක්තිය නැති කිරීම හෝ සතුරා ගැහැණු බවට පත් කිරීම අරමුණ වී තිබේ.) හිදී යම් බව දක්නට ලැබේ. පුරුෂයන්ට එරෙහි මෙම ප්‍රචණ්ඩත්වය පදනම් වී තිබෙන්නේ වීමෙන් අදහස් වන්නේ කුමක්ද යන්න සහ පුරුෂ බලය අභ්‍යාස කිරීම පිළිබඳ සමාජමය වශයෙන් සංස්ලේෂණය වී ඇති අදහසත මත ය. එය පුරුෂයන් විසින් (සහ දුර්ලභ අවසතථාවලදී ස්ත්‍රීන් විසින්) වෙනත් පුරුෂයන් ට හානියක් සිදුකිරීම සඳහා යොදාගනු ලැබේ.

## 2.2 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයය (TFSGBV) යනු කුමක්ද?

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) යන්නේ අදහස් වන්නේ ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) හි ඔන්ලයින් විද්‍යාමාන වීම් ය. වෙනත් වචනවලින් පවසන්නේ නම් තාක්ෂණය හරහා සිදුකරන සෙක්සිස්ට් (ස්ත්‍රී පුරුෂ භේදවාදී), සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) විරෝධී සහ ලිංගිකමය අරුත් ගැන්වීම්වලින් යුතුව ස්ත්‍රීන් කෙරෙහි ද්වේශයෙන් සිදුකරන (misogynistic) ප්‍රහාර මෙමගින් අදහස් වේ. ස්ත්‍රීන් සහ ගැහැණු දරුවන් ද, විවිධත්වයෙන් යුක්ත ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන් ද විශාල වශයෙන් ඉලක්ක වේ. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) යනු, සමාජ මාධ්‍ය හෝ තොරතුරු තාක්ෂණික සන්නිවේදන පද්ධති හරහා සුවිශේෂී වශයෙන් යම් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් ඔවුන් ව හිංසාවට පත් කිරීමට, හිරිහැර කිරීමට, නින්දා කිරීමට, බිය ගැන්වීමට, බලහත්කාරය පෑමට හෝ කිසියම් ආකාරයකින් හානි සිදු කිරීමට ඩිජිටල් මෙවලම් පාවිච්චි කිරීම යි. TFSGBV යන්න ඇනලොග් හෝ 'බොත්තම්' දුරකථන භාවිතයෙන්, හිරිහැර කරන හෝ තර්ජනාත්මක ආකාරයේ ඇමතුම් ලබා දීම සහ එවන් කෙටි පණිවිඩ යැවීම හරහා පවා සිදු කළ හැක.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිදුකිරීම සඳහා යොදාගන්නා ඩිජිටල් වේදිකා වල ප්‍රධාන ආකාර 3 ක් තිබේ. එනම් සමාජ ජාල (social networks), මාධ්‍ය බෙදා හැරීමේ වේදිකා (media sharing platforms) සහ පණිවුඩ සන්නිවේදන වේදිකා (messaging platforms) ය. සමාජ ජාල යනු මිනිසුන් සමග සබඳතා ඇති කර ගැනීමටත් තොරතුරු, අදහස් සහ දැනුම බෙදා ගැනීමටත් යොදාගන්නා ෆේස්බුක් (Facebook) වැනි වේදිකාවන් ය. ඉන්ටග්‍රෑම් (Instagram) වැනි මාධ්‍ය බෙදා ගන්නා වේදිකාවන් ඡායාරූප සහ වීඩියෝ වැනි අන්තර්ගතයන් (content) බෙදාහැරීම සඳහා යොදා ගැනේ. මේ අතර, වට්ස්ඇප් (WhatsApp) වැනි පණිවුඩ සන්නිවේදන කරන වේදිකාවන් මූලික වශයෙන් එකිනෙකා සමග සන්නිවේදනය කිරීමටත්, කෙටි පණිවුඩ (text messages) යැවීමට සහ ලබාගැනීමත්, ඕඩියෝ සහ වීඩියෝ ඇමතුම් ගැනීමටත් යොදා ගනියි.

මේ අනුව තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) යනු සහමුලින්ම වින්දිතයාගේ සමාජ භාවය මත පදනම් ව, අනුමැතියකින් තොර ඕනෑම ලිංගිකමය ක්‍රියාවක් සිදුකිරීමට හෝ ලබාගැනීමට හෝ බලහත්කාරයෙන් ඒ සඳහා උත්සාහ කිරීමට ඩිජිටල් මාධ්‍ය භාවිතා කිරීමයි. මෙම ක්‍රියාවේ අරමුණ පළි ගැනීමේ සිට වින්දිතයා පාලනය කිරීම (බොහෝ විට ස්ත්‍රියක්) දක්වා විහිදී යා හැකි අතර එමගින් අපීරුතාවයට පත් කිරීම, ලැජ්ජාවක් ඇති කිරීම, භීතිය ජනිත කිරීම යනාදිය සිදු වේ.[5] ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සිදුකරන අපරාධකරුවන් මෙන්ම තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිදුකරන අපරාධකරුවන් ද ළඟම මිත්‍රයෙක්, ඥාතියෙක්, සමීප සහකරු, අතීතයේ සිටි සමීප සහකරුවෙකු, සගයෙකු වැනි වින්දිතයා දන්නා අයෙකු මෙන්ම නොදන්නා අයෙකු ද විය හැකිය.[6]

---

[5] 'සමාජභාවය මත පදනම් වූ අන්තර් පුද්ගල සයිබර් අපරාධ' 'Gender Based Interpersonal Cyber Crime' (UNODC, 2020 පෙබරවාරි) <https://www.unodc.org/e4j/en/cybercrime/module-12/key-issues/gender-based-interpersonal-cybercrime.html> ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

[6] එම

උදාහරණ වශයෙන් ලිංගිකමය අරුත් ගැන්වීම්වලින් යුතු හෝ ඍජුවම ලිංගිකමය බලපෑම් සිදුකරන, තමන් අකමැති පණිවුඩ විද්‍යුත් ලිපි (ඊ මේල්) හෝ සමාජ මාධ්‍ය හරහා (සයිබර් ෆ්ලෑෂින් - cyber flashing), සන්නිවේදන යෙදවුම් හෝ කෙටි පණිවුඩ (ටෙක්ස්ට් මැසේජස්) හරහා යැවීම (අනුමැතියෙන් තොරව සිදුකරන 'සෙක්ස්ටින්'- unsolicited sexting), නග්න ඡායාරූප හෝ ලිංගිකත්වය ඍජුව හඟවන වීඩියෝ ලබාගැනීමට තර්ජනය කිරීම හෝ බලහත්කාරය පෑම (සෙක්ස්ටෝෂන් - sextortion), ලිංගිකමය ස්වභාවයෙන් යුතු සමීප ඡායාරූප හෝ නග්න ඡායාරූප බෙදා හැරීම (ඡායාරූප පදනම් කර ගත් ලිංගික අපයෝජනය - image based sexual abuse) සහ ඉලක්කගත තැනැත්තා හිංසනයට ලක් කිරීමට, හිරිහැර කිරීමට, ලැජ්ජා කිරීමට සහ තර්ජනය කිරීමට ව්‍යාජ පැතිකඩ (ෆේක් ප්‍රොෆයිල්ස් - fake profiles) නිර්මාණය කිරීම දැක්විය හැකිය.[7]

## 2.3 සමාජභාවීකරණය වූ ඔන්ලයින් (මාර්ගගත) වෛරී කථනය (GOHS) යනු කුමක්ද?

සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) යන්න සයිබර් අවකාශයේ සිදුවන ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි පුළුල් අර්ථය යටතට වැටෙන අතර, සයිබර් අවකාශයේ සිදුවන ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (TFSGBV) යන්න සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) හි පුළුල් අර්ථය යටතට වැටේ. සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) යන්නෙන් ලිවීමක්, කීමක් හෝ හැසිරීමක් යන කුමන හෝ ආකාරයකින් යම්කිසි තැනැත්තෙකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට අපහාසාත්මක, නින්දාශීලී සහ හානිකර ස්වභාවයකින් පහර දීමක් අදහස් කෙරේ. මෙසේ යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් කණ්ඩායමක් මෙයට ලක් වන්නේ ඔවුන්ගේ ජාතිය, ආගම, සමාජභාවය හෝ වෙනත් කැපී පෙනෙන සහ විභේදනය වී දැක්වෙන ලක්ෂණ/ ලක්ෂණයන් නිසා විය හැකිය.

අපවාදයට (අපකීර්තියට) පැමිණවීම, නින්දා කිරීම සහ/හෝ යම්කිසි තැනැත්තෙකුගේ හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ලිංගික සහ/හෝ සමාජභාවී අනන්‍යතාවය පදනම් කරගෙන වෛරය හෝ ප්‍රචණ්ඩත්වය ඇවිස්සීම සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) ට ඇතුළත් වේ. සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සඳහා මූල හේතුව ස්ත්‍රීන් සහ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන් කෙරෙහි දක්වන වෛරයකි. මෙම වෛරයට පදනම් වන්නේ සමාජභාවී සම්මතයන් සහ අපේක්ෂාවන් ය. තවද පුරුෂ මූලික සමාජයේ පුරුෂයන් විසින් (ඇතැම් ස්ත්‍රීන් විසින් ද පිළිගන්නා) භාරගන්නා බලය සහ ඉහළ බව පිළිබඳ හැඟීම ද මෙයට පදනම් වේ.

ශ්‍රී ලංකාවේ ලිංගික ශ්‍රමිකයන්, සංක්‍රමණික ශ්‍රමිකයන්, දේශපාලනයේ නියැළෙන කාන්තාවන්, මානව හිමිකම් ආරක්ෂා කරන්නියන් සහ ප්‍රසිද්ධ බවක් සහිත ස්ත්‍රීන් හා ස්ත්‍රීවාදී පුද්ගලයන් මෙම සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සඳහා වැඩි වශයෙන් ඉලක්ක වන බව පෙනේ. බොහෝ විට මෙම 'වෛරය/ද්වේශය' ස්ත්‍රීන් කෙරෙහි වන ද්වේශයක් වන අතර, එය මෙම ස්ත්‍රීන් විසින් සමාජභාවී සම්මත අතික්‍රමණය කරන්නේ ය යන මතය තුළින් පැන නැගුණකි. උදාහරණයක් වශයෙන් වෛරී කථන කැම්පේන් හරහා ලිංගික නියෝජ්‍යත්වය (agency) සහ සමාජභාවී තත්වය පිළිබඳ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම දැක්විය හැක.

---

[7] එම.

ස්ත්‍රීන්, ගැහැණු ළමුන් සහ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන්ට ප්‍රහාර එල්ල කිරීමට ආයුධයක් බවට පත්වීම හැරුණු විට සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS), වාර්ගික සහ ආගමික කණ්ඩායම් සමස්තයට පහර දීම සඳහා ද පාවිච්චි වෙයි. මෙය ශ්‍රී ලංකාවේදී දමිල සහ මුස්ලිම් ප්‍රජාවන් ට එරෙහිව යොදාගෙන ඇත. මෙහිදී සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) ප්‍රතිචාර වර්ගවාදී වීම සහ ජාතිවාදී වීම සිදු වේ. මෙම ප්‍රහාර නිරන්තරයෙන්ම දියත් වන්නේ මෙකී වාර්ගික සහ/හෝ ආගමික කණ්ඩායම්වල ස්ත්‍රී සාමාජිකයන්ට එරෙහිව බව ද වාර්තා වේ. මුස්ලිම් ප්‍රජාවට එරෙහිව මෑතකදී හට ගැනුණු, විශේෂයෙන්ම පාස්කු බෝම්බ සිද්ධියෙන් පසුව හටගත් සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) ප්‍රහාර රැල්ලේදී ස්ත්‍රී ආකාර ශරීරය සහ ස්ත්‍රී සමාජභාවය (එනම් හිජාබය ඇඳීම, වඳ පෙති සහ කොත්තු රොටී, වඳ බව ඇති කරන කාන්තා යට ඇඳුම් යනාදී වශයෙන්) මත මෙම ප්‍රහාර එල්ල වූ බව කෙනෙකුට නිරීක්ෂණය කළ හැක. මෙවැනි තත්වයකදී සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) විසින් සිදුකරන්නේ තනි පුද්ගලයෙකුගේ භෞතික ආරක්ෂාවට තර්ජනයක් පමණක් නොවේ. ඒ වෙනුවට, එම තනි පුද්ගලයාගෙන් හෝ ස්ත්‍රී රූපයෙන් සංකේතවත් වන සකල කණ්ඩායමේ ම ආරක්ෂාවට එමගින් තර්ජනයක් එල්ල වේ. උදාහරණයක් වශයෙන්, සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) දක්වන වචන සමග හිජාබය අඳින මුස්ලිම් කාන්තාවකගේ මීම් (memes) සමාජ මාධ්‍ය හරහා සංසරණය වන විට එමගින් සමස්තයක් ලෙස සකල මුස්ලිම් ප්‍රජාව වෙත ම ද්වේශයක් සහ සැක කටයුතු බවක් අවුස්සාලීම සිදු කරන නමුත්, එය සුවිශේෂී ලෙසම මුස්ලිම් කාන්තාවන්ට එරෙහිව සිදුවන්නේ ඔවුන්ට හානි සිදු වීමේ සත්‍ය අවදානමක්ට ඔවුන් ලක් කරමිනි.

සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) යනු හුදෙක් හානිකර කථනය පමණක් යැයි බොහෝ අය උපකල්පනය කළත් ඔන්ලයින් ප්‍රකාශන සහ ඕෆ්ලයින් ප්‍රචණ්ඩත්වය අතර සහසම්බන්ධය මනා ලෙස මුල් බැස ගෙන ඇති විට සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) නියත වශයෙන්ම ඔන්ලයින් අවකාශය ඉක්මවා ඕෆ්ලයින් අවකාශය වෙතට ද ඇතුළු වීමේ භයානක හැකියාවෙන් යුක්ත වේ. මෙහි ප්‍රතිඵලය වන්නේ ආගමික හෝ ජන වාර්ගික කණ්ඩායම් හෝ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන් ට එරෙහිව ඩිජිටල් වේදිකා හරහා පැතිරෙන වෛරය සහ නින්දාව ඔවුන්ට එරෙහිව මිනිසුන් උසි ගැන්වීම වෙත යොමු කිරීමයි. තවද එමගින් මෙම තැනැත්තන්ට භෞතික හානි ගෙන දීමට සමත් වෛරී කථනයේ භෞතික ප්‍රකාශනයට පහසුකම් සැලසීම සිදු කරයි.

## 2.4 ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) හි ව්‍යාප්තිය සහ ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නිවේශනය

පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ප්‍රචණ්ඩත්වයේ සංස්කෘතියක පුළුල් ව්‍යාප්තිය නොවැළැක්විය හැකි කාරණයකි. කෙයා ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (Care International Sri Lanka) විසින් 2013 වසරේදී පිරිමි බව සහ සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (GBV) පිළිබඳ සිදුකළ අධ්‍යයනයකින් සොයාගත්තේ පුරුෂයන්ගෙන් බහුතරයක් විසින් පිරිමිකම යන්න ඒකාධිපතිත්වය ට සහ ප්‍රචණ්ඩත්වය ට සම්බන්ධ කරන බවයි. තවද 'දැඩි බව' යන්න පිරිමිකම ලෙස අවබෝධ කර ගන්නා බවත්, ස්ත්‍රීන් සහ පුරුෂයන් යන කොටස් දෙකම තුළ පිරිමිකරණයට ලක් වූ ප්‍රචණ්ඩත්වය සහ පුරුෂ බලය යෙදවීම සම්බන්ධයෙන් දැවැන්ත පිළිගැනීමක් පවතින බවත් සොයාගන්නා ලදී.[8] පිරිමි කම යනු ඒකාධිපතිත්වය සහ ප්‍රචණ්ඩත්වය යන්නෙන් අර්ථ නිරූපණය වන බවට වන මෙම සාමාන්‍ය පිළිගැනීම ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සඳහා මග පෙන්වන, ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ පදනම බවට පත් ව තිබේ. මෙයට අමතරව වසර ගණනක යුද්ධය විසින් වාර්ගික-ජාතිවාදය, වාර්ගික හා ආගමික ප්‍රජාවන්ගේ ධ්‍රැවීකරණය සහ සමාජයේ මිලිටරීකරණය සඳහා සරු බිමක් නිර්මාණය කර තිබෙන අතර, එමගින් වාර්ගික ආගමික අනන්‍යතාවය, කුලය සහ පන්තිය යන අන්තර්ඡේදනයන් සමග ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) හි දරුණු කම සම්මිශ්‍රණය කර තිබේ.

වයස අවුරුදු 18-49 ත් අතර වූ පුරුෂයන්ගෙන් 20%ක් සිය සමීප සහකරු වෙත ලිංගික ප්‍රචණ්ඩත්වය මුදා හරින බව ද කෙයා ඉන්ටනැෂනල් ආයතනයෙන් සිදුකරන ලද අධ්‍යයනයෙන් සොයාගන්නා ලදී. මේ අතර 6.2% ක් පුරුෂයෝ තමන්ගේ සහකරු නොවන අයෙකු ලිංගික ප්‍රචණ්ඩත්වයට පත් කරන බව පිළිගත්හ.[9] පැහැදිලිව ම දැකගත හැකි වූයේ ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සහ අප්‍රසිද්ධ අවකාශයන් තුළ ස්ත්‍රීන් සහ සෙසු ස්ත්‍රීආකාර ශරීර ක්‍රමානුකූල ලිංගිකකරණය (systematic sexualization) ට, වාස්තවිකකරණය (objectification) ට, ප්‍රචණ්ඩත්වය ට සහ හිංසනයට ලක් කරන බවයි. 2017 වසරේදී එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) විසින් සිදුකරන ලද සමීක්ෂණයකට අනුව ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් සහ ගැහැණු ළමුන්ගෙන් 90%ක් පොදු ප්‍රවාහන සේවයේදී ලිංගික හිංසනය ට ලක් ව ඇති අතර,[10] එහිදී සෑම කාන්තාවන් 4 දෙනෙකුගෙන් එක් අයෙකුම (24.9%) දන්නා හෝ නොදන්නා තැනැත්තන් අතින් එසේ ලිංගික හිංසනයට ලක් වන විට ඔවුන්ගේ වයස අවුරුදු 15 ට ඉහළ විය.[11] වසර ගණනාවක් මුළුල්ලේ සිදුකරනු ලැබූ පර්යේෂණ අධ්‍යයනයන් ගණනාවකින් තහවුරු කර තිබෙන්නේ සමාජයේ කිසිදු ස්ථරයක කාන්තාවන් තමන් වෙත එල්ල වන ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) වෙතින් පළා යන්නට සමත් ව නැති බවයි. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA) විසින් 2011 වසරේදී සිදුකරන ලද අධ්‍යයනයකින් සොයාගත්තේ වැවිලි ක්ෂේත්‍රයේ, නිදහස් වෙළඳ කලාපයේ සහ කාර්මික ක්ෂේත්‍රයේ ස්ත්‍රීන් වැඩපොළේදී ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ට බඳුන් වන බවයි. ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන (රාජ්‍ය විශ්ව විද්‍යාල) විසින් සිදුකරනු ලබන අධ්‍යයන වලින් සොයාගත්තේ විශ්ව විද්‍යාල ව්‍යුහය තුළ ස්ත්‍රී සහ පුරුෂ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) වලට බඳුන් වන බව සහ එම ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV), පැහැදිලිව ම විශ්ව විද්‍යාල පද්ධතියේ නවක වධය තුළ ව්‍යාප්ත ව පවතින බවයි.[12]

---

[8] ඩි මෙල් නෙලුෆර්, පීරිස් ප්‍රදීප් සහ ගෝමස් ශ්‍යාමලා, 'Broadening gender (Why masculinities matter? : Attitudes, practices and gender-based violence in four districts in Sri Lanka' (Care International Sri Lanka, 2013)

[9] එම.

[10] Population Matters, 'Sexual Harassment on Public Buses and Trains in Sri Lanka' (UNFPA Policy Brief, March 2017) < https://srilanka.unfpa.org/sites/default/files/pub-pdf/FINAL%20POLICY%20BRIEF%20-%20ENGLISH_0.pdf > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

[11] ජනගහන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. Women's Wellbeing Survey - 2019 (2020).

[12] ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය (SLMA), Review of Research Evidence on Gender-Based Violence in Sri Lanka (2011); විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC), සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය සහ UNICEF, Prevalence of Ragging and Sexual and Gender-Based Violence in Sri Lankan State Universities (2022).

ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) චිරස්ථායි කර ඇති මෙම පුරුෂාධිපත්‍යයේ සහ ප්‍රචණ්ඩත්වයේ අධිපතිවාදී සංස්කෘතිය තුළ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ද සිදු වේ. තවද අන්තර්ජාලය වෙත ප්‍රවේශ වන බහුතර ජනගහනයක් විසින් එයට පහසුකම් සැපයීම සිදු කරයි. 2024 ආරම්භයේදී ශ්‍රී ලංකාවේ අන්තර්ජාල නිවේශනය මුළු ජනගහනයෙන් 56.3ක් විය.[13] Kepios විශ්ලේෂණ දර්ශකයන්ට අනුව ශ්‍රී ලංකාවේ අන්තර්ජාල පරිශීලකයන් සංඛ්‍යාව 2023 ජනවාරි සහ 2024 ජනවාරි අතර කාල සීමාව තුළ දී ලක්ෂ 460කින් (+3.9%)ඉහළ ගොස් ඇති. තවද, ගෝලීය වශයෙන් නිරීක්ෂණය වී ඇති පරිදි ශ්‍රී ලංකාවේ ද කෝවිඩ්-19 වසංගතයෙන් ප්‍රතිඵල වූ ලොක්ඩවුන් තත්වය මගින් අන්තර්ජාල භාවිතයේ ඉහළ යාමක් මෙන්ම ස්මාට් ෆෝන් භාවිතයේ ඉහළ යාම මගින් සමාජ මාධ්‍යවලට සීඝ්‍ර හුරුවීමක් ද සිදු ව තිබේ. ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය පරිශීලකයන්ගෙන් 98.8% ක් ම එසේ කරන්නේ ස්මාට්ෆෝන් මගින් බව DataReportal වාර්තා කරයි. මිලියන 8.20 ක් වන සමාජ මාධ්‍ය පරිශීලකයන්ගෙන් 36.6%ක් ස්ත්‍රීන් වන අතර, 63.4%ක් පුරුෂයන් වේ. ශ්‍රී ලංකාවේ ජනගහනය මෙන් 149.9%ක්, එනම් මිලියන 32.29 ක ප්‍රමාණයක් සෙලියුලර් ජංගම දුරකථන පවතින බව ද සඳහන් කළ යුතු ය. මෙම උනන්දු ජනක කාරණය පෙන්වා දෙන්නේ ජංගම දුරකථනය මෙන් සිම්පත ජංගම නොවන හෙයින් තනි පුද්ගලයෙකු සතුව එක් සිම් පතකට වඩා වැඩි සිම් සංඛ්‍යාවක් පවතින බව ය.

ජංගම දුරකථන භාවිතයේ මෙම සීඝ්‍ර ඉහළ යාම, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි තියුණු වැඩිවීමක් වෙත දායක වෙමින් තිබේ. දත්ත ආරක්ෂාව පිළිබඳ දැනුම මදිකම, නව යොවුන් පරපුර අතර ස්මාට් ෆෝන් භාවිතයේ ඉහළ යාම සහ ඔන්ලයින් වැරදි සම්බන්ධයෙන් නියාමන රීති අඩු කම වැනි සාධක ගණනාවක දායකත්වය හේතුවෙන් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි ඉහළ යාම සිදු ව තිබේ. අනුමැතියකින් තොර සමීප ඡායාරූප බෙදා හැරීම, සෙක්ස්ටෝෂන් (sextortion) වෙනස් කළ පින්තූර සහ ඩීප් ෆේක්ස් (Deepfakes)[14], සහ සමාජ මාධ්‍ය ගිණුම්වල අනන්‍යතාවය වෙනස් කර පෙන්වීම, ශ්‍රී ලංකාවේ නිරීක්ෂණය කළ හැකි සුලබ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ආකාර වේ. මෙකී තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිදුවීම් ෆෙස්බුක්, ඉන්ස්ටග්‍රෑම් සහ වට්ස්ඇප් වැනි පණිවුඩ හුවමාරු කරන වේදිකාවල ප්‍රබල වශයෙන් සිදු වේ.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ එහි බලපෑම් පිළිබඳ වර්ධනය වෙමින් පවතින දැනුවත්භාවය නොතකා, ඩිජිටල් සාක්ෂරතාවයේ සුපැහැදිලි හිඩැස්, ස්ත්‍රීන් ට එරෙහි ප්‍රචණ්ඩත්වය සාමාන්‍යකරණය කිරීම සහ වින්දිතයන්ට දොස් පැවරීමේ සංස්කෘතියක් මෙම පරිශ්‍රමයන්වලදී දැකගත හැකි ව තිබේ. බාල, රට පුරා සිටින පාසල් වියේ ජනගහණය අතර තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පැතිර තිබෙන්නේ අන්තර්ජාලය හරහා ළමුන් ලිංගික ව සූරාකෑම සමග තැතිගන්වන පරිදි අතිච්ඡාදනය වන ආකාරය පෙන්වා දෙමිනි.

---

[13] සයිමන් කෙම්ප්, 'Digital 2022: Sri Lanka' (Datareportal, 15 February 2022) <https://datareportal.com/reports/digital-2024-sri-lanka > ප්‍රවේශ දිනය 2025 සැප්තැම්බර් 1.

[14] Deep fakes (ඩීප් ෆේක්ස්) - දැනට පවතින රූපයක හෝ වීඩියෝවක සිටින පුද්ගලයෙකු කෘත්‍රිම බුද්ධිය (AI) යොදාගෙන වෙනත් කෙනෙකුගේ සමානතාවයකින් ප්‍රතිස්ථාපන කරන කෘතිම මාධ්‍යයකි.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ශ්‍රී ලංකාවේ වැඩිම වේගයකින් වර්ධනය වෙමින් පවතින සමාජභාවීකරණය වූ ප්‍රචණ්ඩත්වයේ ආකාරයයි.[15] මෙහිදී ස්ත්‍රීන් සහ ගැහැණු ළමුන් වඩාත් ප්‍රමුඛ ලෙස ඉලක්ක වී තිබේ. කාන්තා පිහිට (Women In Need) විසින් 2000 වසරේදී සිදුකළ අධ්‍යයනයකින් සොයාගත්තේ සෑම කාන්තාවන් 3 දෙනෙකුගෙන් ම එක් අයෙක් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි කිසියම් වූ ප්‍රභේදයක වින්දිතයෙකු ව දැන සිටිනා බවයි. එය ඔන්ලයින් සහ ඕෆ්ලයින් ප්‍රචණ්ඩත්වය කොතරම් සමීප ලෙස එකිනෙක ප්‍රතිබිම්භගත කරන්නේ ද යන්න සහ පොදු සමාජභාවී සම්මතයන් ට අනුව එය කොතරම් සිද්ධ වන්නේ ද යන්න පෙන්වා දෙන සාක්ෂියකි. කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, යුනිසෙෆ් සහ සේව් ද චිල්ඩ්‍රන් විසින් සිදුකරන ලද හවුල් පර්යේෂණයක් මගින්, අවම වශයෙන් දරුවන්ගෙන් 28%ක් දෙනා යම්කිසි ආකාරයක සයිබර් ප්‍රචණ්ඩත්වයක් අත්දැක ඇති බව හෙළිදරව් කරයි. මෙයට 'අසංවර පණිවුඩ' වලට නිරාවරණය වීම ද ඇතුළත් වේ. මේ අතර දරුවන්ගෙන් 20%ක් දෙනාගේ 'අසංවර' පින්තූර ඔවුන්ගේ අනුමැතියෙන් තොරව අන්තර්ජාලය තුළ බෙදාහැර තිබිණි.[16]

වාර්තා වන තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිද්ධි සංඛ්‍යාව ද වසර ගණනාවක් තිස්සේ නොනැවතී ඉහළ ගොස් තිබෙන්නේ[17] ඉහළ යන ඩිජිටල් නිවේශනය, ඉහළ යන නව අන්තර්ජාල වේදිකා භාවිතය, සහ මෑත කාලීන ව කෝවිඩ්-19 වසංගතය සමග ඉදිරියට යාමට නීති සාධන ආයතන උත්සාහ දරණ අතරවාරයේ ය. නීති සාධන යාන්ත්‍රණ අතර ඔන්ලයින් ළමා ලිංගික සූරාකෑමේ අන්තර්ගතයන්[18] පිළිබඳ කටයුතු කරන විශේෂ ඒකකයක් ද එකතු විය. මෙය, වයස අවුරුදු 15 ක දැරියක මාර්ගගත ක්‍රමයට ළමා වෙළඳාම (කුට්ටනය) ට ලක් කිරීමේ බරපතළ සිද්ධියකට ප්‍රතිචාර වශයෙන් එක් වූ යාන්ත්‍රණයකි.[19]

අනුමැතියකින් තොරව සමීප ඡායාරූප සහ වීඩියෝ බෙදා හැරීම සඳහා වූ විස්තීරණ හා සැඟවුණු ජාලයන් ට, වට්ස්ඇප් (WhatsApp) සහ ටෙලිග්‍රෑම් (Telegram) වැනි පණිවුඩ යෙදවුම්වල ඉහළ යන ජනප්‍රියත්වය විසින්, අවසානාවන්ත ලෙස ඉඩ දී තිබේ. පාසල් යන පිරිමි ළමුන් අතර මෙවැනි සුවිශේෂී ජාලයන්ගේ ව්‍යාප්තිය මනා ලෙස සටහන්ගත කර තිබෙන අතර, මෙහිදී ළාබාල පිරිමි ළමුන් මේවාට නිතරම සම්බන්ධ වන්නේ සගයන්ගෙන් එල්ල වන පීඩනය සහ සිය සම වියේ මිතුරියන්ගේ ක්‍රමානුකූල ඉලක්ක වීම සමග සම්බන්ධ වෙමිනි. මෙකී 'ලීක් වූ' අන්තර්ගතයන් තුළ පෙනෙන නින්දා සහගත බව සහ අවමන් සහගත බව ද සමාජ මාධ්‍ය තුළ බහුල ව පැතිර තිබේ. වින්දිතයන් ට හිංසා කිරීම සඳහා නිර්මාණශීලී ක්‍රම සොයාගැනීමේදී සමාජ මාධ්‍ය පරිශීලකයන් අතර මීම් (meme) සංස්කෘතිය වැඩි වැඩියෙන් සාමාන්‍ය වෙමින් පවතියි. එපමණක් නොව, ස්ත්‍රිය භාණ්ඩයක්/ වස්තුවක් වශයෙන් යොදාගනිමින් වෛරී කථනය මුදා හැරීමටත්, සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුච්යර) සහ අන්තර්ලිංගික (LGTBQI+) ප්‍රජාව ට එරෙහි වීමටත් සමාජ මාධ්‍ය සහ සෙසු ඩිජිටල් මෙවලම් විසින් ඇතැම් විට නිර්නාමිකත්වය රැක දෙමින් වේදිකාවක් ද සපයයි.

---

15 දිනිති ගුණසේකර, 'Online gender-based violence: The new normal of sexual harassment' (The Morning, 28 February 2021) < https://www.themorning.lk/online-gender-based-violence-the-new-normal-of-sexual-harassment/ > accessed 05 March 2023'

16 Save the Children යනාදීහු., Online Violence Against Children in Sri Lanka (March 2022) < https://srilanka.savethechildren.net/sites/srilanka.savethechildren.net/files/Online%20Violence%20Against%20Children%20in%20Sri%20Lanka.pdf > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

17 සුමුදු චාමර, 'Unsafe outside, unsafe online' (The Morning, 13 March 2022) <https://www.themorning.lk/unsafe-outside-unsafe-online > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

18 පවනි හපුආරච්චි, 'Special Police Unit to crack-down on Child Pornography' (Newsfirst, 29 ජූලි 2021) <https://www.newsfirst.lk/2021/07/29/special-police-unit-to-crack-down-on-child-pornography/ > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

19 භවානි ෆොන්සේකා, 'The Growing Dangers of Online Sexual Exploitation of Children' (Groundviews" 20 November 2021) <https://groundviews.org/2021/11/20/the-growing-dangers-of-online-sexual-abuse-of-children/ > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

## 2.5 මානව හිමිකම් උල්ලංඝනයන්

ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) යනු, බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් වශයෙන් පිළිගැනීම ද වැදගත් ය. ජීවත් වීමට ඇති අයිතිය, වධහිංසාව හා කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම්වලින් නිදහස් වීමට ඇති අයිතිය මෙන්ම සමාජභාවය, ජාතිය, දේශපාලන මතය හෝ ලිංගික දිශානතිය (නැඹුරුතාවය) මත (සෙසු අය අතර) වෙනස්කොට සැලකීම්වලට ලක් නොවී සිටීමේ අයිතිය, නීතියේ සමාන රැකවරණය, තමන් ව නිදහසේ ප්‍රකාශනය කර ගැනීමට ඇති අයිතිය සහ පුද්ගලික පවුල් ජීවිතයක් ගත කිරීමට ඇති අයිතිය මානව හිමිකම් වශයෙන් අන්තර්ජාතික සම්මුති ගණනාවක පිළිගනියි. කායික තුවාළ, මානසික භ්‍රාන්තිය සහ ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) වල සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හා සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) දීර්ඝ කිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් ස්ත්‍රීන්ට වෙනස් කොට සැලකීම යනාදිය එක්සත් ජාතීන්, යුරෝපා කවුන්සිලය හා සෙසු කලාපීය මානව හිමිකම් ආරක්ෂණ පද්ධති හරහා මානව හිමිකම් උල්ලංඝනයන් වශයෙන් පිළිගෙන තිබේ.[20] ස්ත්‍රීන් ට එරෙහිව කෙරෙන වෙනස්කම් පිටුදැකීමේ කමිටුව (සීඩෝ-CEDAW) විසින් සෙසු දේ අතර, ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) විසින් ස්ත්‍රියගේ ජීවත් වීමේ අයිතිය, වධ හිංසාවෙන්, කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම්වලින් නිදහස සහ නිදහසේ අයිතිය හා තැනැත්තාගේ ආරක්ෂාව උල්ලංඝනය කරන බව වෙන් වෙන් වශයෙන් පිළිගෙන තිබේ.[21]

සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) ප්‍රජාවට එරෙහි ව සිදුකරන ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ඔවුන්ගේ මානව හිමිකම් උල්ලංඝනයක් බව එක්සත් ජාතීන් විසින් ද පිළිගෙන තිබේ.[22] අන්තර්ජාතික නෛතික බැඳීම් හා එක්සත් ජාතීන්ගේ වැඩරාමුව තුළ රාජ්‍යයන් වෙත පවරා ඇති යුතුකම් මගින්, ස්ත්‍රීන්ගේ හා සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) තැනැත්තන්ගේ අයිතිවාසිකම් සුරැකීම ප්‍රගාමී ලෙසත් සවිඥානික ලෙසත් සිදුකළ යුතු බවට රාජ්‍යයන් දිරිමත් කරයි. මෙහිදී රාජ්‍යය විසින් ඉතාම අවම වශයෙන් සිදුකළ යුතු දේ අතර, අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒම සඳහා සහ ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) හටගැනීම වැළැක්වීම සඳහා නීතිමය යාන්ත්‍රණ සකස් කිරීම මගින් නීතියේ සමාන රැකවරණය තහවුරු කළ යුතු ය.

සිය මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේදී ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව විසින් තැනැත්තෙකුට වධහිංසාවෙන්, අමානුෂික අවමන් සහගත සැලකිල්ලෙන් හෝ දඬුවමෙන් මිදීමට ඇති අයිතිය සහ නීතිය ඉදිරියේ සමාන රැකවරණය පිළිගනියි. බලාත්මක නීති ක්‍රියාවට නැංවීමට රාජ්‍ය අසමත් වන්නේ නම් ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) ක්‍රියාවන් වැනි - නමුත් එයට පමණක් සීමා නොවූ, වින්දිතයෙකු ව සිය ආරක්ෂාව හෝ සිය ඥාතීන්ගේ හෝ මිතුරන්ගේ හෝ ආරක්ෂාව පිළිබඳ බිය ගන්වමින්, මානසික භ්‍රාන්තිය ඇති කරමින්, අනුමැතියෙන් තොරව සමීප ඡායාරූප බෙදා හරිමින්, ඩිජිටල් වේදිකා හරහා තර්ජනය හෝ බලහත්කාරය යටතේ ලිංගික වාසි ලබා ගනිමින් කටයුතු කරන විට රාජ්‍යය ඉහත කී නීතිය ඉදිරියේ සමාන රැකවරණය සහති කිරීමට අසමත් ව තිබේ.

---

20 යුරෝපා කවුන්සිලය, Explanatory Report to the Council of Europe Convention on Preventing and Combatting Violence Against Women and Domestic Violence (Council of Europe Treaty Series No: 210); එක්සත් ජාතීන්ගේ මහ සභාව, 'Discrimination and violence against individuals based on their sexual orientation and gender identity: Report of the Office of the United Nations High Commissioner for Human Rights' UN Doc A/HRC/29/23 (2015 මාර්තු 04)

21 ස්ත්‍රීන්ට එරෙහිව වෙනස්කම් පිටුදැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව (CEDAW), CEDAW General Recommendation No. 19: Violence against women, 1992 <https://www.refworld.org/docid/52d920c54.html > ප්‍රවේශ දිනය 2023 ජනවාරි 07.

22 මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය, Born Free and Equal: Sexual Orientation, Gender Identity and Sex Characteristics in International Human Rights Law (2nd edn, United Nations 2019).

# 3 තාක්ෂණය සමග බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි ආකාර/ ප්‍රභේද

## 3.1 අනුමැතියෙන් තොර සමීප සබඳතා පින්තූර බෙදා හැරීම (Non-Consensual Intimate Image (NCII) Sharing) සහ පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය (Image-Based Sexual Abuse (IBSA) හෙවත් සුලබ ලෙස පවසන පරිදි 'පළිගැනීම සඳහා කාමුක දර්ශන යොදාගැනීම' (Revenge Pornography)

සමාජ මාධ්‍යවල සම්ප්‍රාප්තිය විසින් අප සන්නිවේදනය කරන ආකාරය සහ සබඳතා ගොඩ නගා ගන්නා ආකාරය විශාල වශයෙන් වෙනස්කම්වලට ලක් කර තිබේ. තවද මෙය අනුරාගී සහ ලිංගික සබඳතා දක්වා ද දිව යයි. කෙසේ වෙතත්, සයිබර් ආරක්ෂාව සහ කැමැත්ත (අනුමැතිය) පිළිබඳ අඩු අවබෝධය විසින් ඔන්ලයින් (මාර්ගගත) වේදිකාවන් අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) සහ වීඩියෝ නිර්මාණය, බෙදා ගැනීම හා බෙදා හැරීම සඳහා වූ සරු පසක් ප්‍රතිඵල කර තිබේ.

අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) බෙදාහැරීම් ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමග බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වඩාත්ම අන්තගාමී සහ ප්‍රබලතම ආකාරය බවට ක්‍රියාකාරිකයන් සහ නීති සාධන බලධාරීන් එකඟ වී තිබේ. 'වින්දිතයාට දොස් පැවරීමේ ඇඟවුම සහ පළිගැනීමේ චේතනාව ප්‍රචණ්ඩත්වයේ පූර්ව අවශ්‍යතාවය යැයි උපකල්පනය කිරීම හේතුවෙන් පළි ගැනීම සඳහා කාමුක දර්ශන යොදාගැනීම' (Revenge Pornography) යන්න සීඝ්‍රයෙන් ඉදිරි අදියර වෙත පියනගමින් තිබේ. එපමණක් නොව, පළි ගැනීම සඳහා කාමුක දර්ශන යොදාගැනීම අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) හි එකම අභිප්‍රාය නොවේ. පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය (IBSA) වෙත මග පාදන අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) තුළ සමීප හෝ වින්දිතයා අසීරුවේ හෙළන පින්තූර බෙදා හැරීමේ තර්ජනය ද, මෙකී පින්තූර මාර්ග ගත ව සැබෑ ලෙසම බෙදා හැරීමේ තර්ජනය තරමට ම ඇතුළත් ය. අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) බෙදාහැරීම් (හෝ පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය (IBSA) තුළ ලිංගිකමය අයුතු වාසි ලබාගැනීමට සහ වින්දිතයාගෙන් මූල්‍යමය වාසි ලබාගැනීම, දර්ශනාස්වාදය (දැකීමෙන් ආශ්වාදය ලැබීම - voyeurism), ලිංගිකමය අයුතු ත්‍යාග ලබාගැනීම (sexual gratification) සහ පාලනය කිරීම ද ඇතුළත් ය.[23]

[23] Gender Based Interpersonal Cyber Crime' (UNODC, February 2020) <https://www.unodc.org/e4j/en/cybercrime/module-12/key-issues/gender-based-interpersonal-cybercrime.html > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය (IBSA) වෙත මග පාදන අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) හි සෙසු ආකාර/ ප්‍රභේද වන්නේ “up-skirting” සහ “down-blousing” ය. “up-skirting” හිදී ස්ත්‍රියකගේ සායක, “down-blousing” හිදී ස්ත්‍රියකගේ බිලවුසයක පහළ කොටසේ ඡායාරූපයක් ගෙන එම පින්තූර ඩිජිටල් වේදිකා තුළ සංසරණය කරවීම හෝ ප්‍රකාශයට පත් කිරීම සිදු කරයි. තවද, අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) බෙදා හැරීම් සහ පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය (IBSA), රහසේ සිදුකරන පටිගත කිරීම්, ප්‍රසිද්ධ හෝ පුද්ගලික ස්ථානවලදී සැඟවූ කැමරා මගින් ඡායාරූප ගෙන ‘සයිබර් ෆ්ලෑෂින්’ (cyber-flashing) කිරීම හෙවත් එම ඡායාරූප ඩිජිටල් වේදිකා මත යවමින් අදාළ තැනැත්තා හෙළිදරව් කිරීම සිදු කරයි.

මෙහිදී සිදු කළ පුළුල් නිරීක්ෂණය, ලිංගිකත්වය ආයුධයක් බවට පත් කර ස්ත්‍රීන් ට සහ ගැහැණු ළමුන් ගේ කීර්තියට හානි කිරීම හා ඔවුන්ට මානසික හානියක් කිරීම බව යි.

## 3.2 මෝර්ෆින් (Morphing) හෙවත් පින්තූර සහ වීඩියෝ වෙනස් කිරීම

තවත් සුලබ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ආකාරයක්/ ප්‍රභේදයක් වන්නේ ‘මෝර්ෆින්’ (Morphing) ය. සාමාන්‍යයෙන් මෙහිදී වින්දිතයාගේ මුහුණට වෙනත් අයගේ නග්න ශරීර සම්බන්ධ කිරීම සිදු කිරීමත් අශ්ශීල පින්තූර නිර්මාණය කිරීමත් සිදු කරන්නේ වින්දිතයා ව නින්දාවට පත් කරමින් සහ අපකීර්තියට පමුණුවමිනි. මෝර්ෆින් ක්‍රමයට සිදුවන තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වලට නිර්මාණය, ප්‍රගුණනය හෝ එසේ වෙනස් කළ ඡායාරූප සහ වීඩියෝ ප්‍රගුණනය කරන බවට වන තර්ජන ඇතුළත් වේ. මුහුණු මෝර්ෆින් කරන මෘදුකාංග වැඩසටහන් නිර්මාණය වීම මගින් කීර්තියට සිදුවන හානිය සහ මානසික භ්‍රාන්තිය උත්සන්න වීම සිදු කරයි. යන්ත්‍ර දැනුම විසින් ඇල්ගොරිදමයක් භාවිතා කරමින් මුහුණු වීඩියෝවලට බද්ධ කිරීමට සාදා තිබෙන ‘ඩීප් ෆේක්’ (deep fake) වීඩියෝ නිර්මාණය කරන මෘදුකාංග යෙදවුම් විසින් කාලයත් සමග මොර්ෆින් ගැටළුව උග්‍ර කර තිබේ. මෙවැනි වෙනස් කරන ලද වීඩියෝ වාණිජමය කාමුක වෙබ් අඩවි වෙත ද නිකුත් කර ඇත. ඉහත සාකච්ඡා කළ පරිදි වෙනස් කළ පින්තූර සහ වීඩියෝ මගින් ප්‍රධාන වශයෙන්ම වින්දිතයා ට කීර්තිමය හානියක් සිදු කිරීමට යොදා ගනියි. මූල්‍යමය පෙළඹීම මෙහිදී නොමැති අතර, බොහෝ විට එය ද්විතියික අරමුණ විය හැකිය.

## 3.3 ඩොක්සින් (Doxxing)

ඩොක්සින් (Doxxing) ඇතැම් විට doxing ලෙස ද හැඳින්වේ. මෙමගින් මාර්ග ගත ක්‍රමයෙන් ‘අවසර නොලත් පුද්ගලික තොරතුරු හෙළිදරව් කිරීම’ අදහස් වේ. මෙය සත්‍ය සහ විශ්වාසනීය තොරතුරු සහ/හෝ යම් තැනැත්තෙකු හඳුනාගත හැකි තොරතුරු අන්තර්ජාලය තුළ ප්‍රකාශනයට පත් කිරීම වේ. මෙහිදී මෙම යම් තැනැත්තෙකු හඳුනාගත හැකි තොරතුරුවලට පුද්ගලික දුරකථන අංකය, සේවාස්ථානයේ දුරකථන අංකය, සේවාස්ථානය, නිවසේ ලිපිනය, ඡායාරූපය, පවුලේ තොරතුරු සහ වින්දිතයාගේ හෙවත් මෙම තොරතුරුවල හිමිකරුගේ අනුමැතියෙන් තොරව එම තැනැත්තාගේ මූල්‍යමය තොරතුරු පවා හෙළිදරව් කිරීම ඇතුළත් වේ.

ඩොක්සින් සාමාන්‍යයෙන් සිදු කරන්නේ වින්දිතයාට තර්ජනය කිරීමේ, හිරිහැර කිරීමේ හෝ හානියක් සිදුකිරීමේ හෝ එවැන්නකට උල්පන්දම් දීමේ අභිලාෂයෙන් යුතුව ය. ඩොක්සින් සිදුකිරීම සඳහා වන පෙළඹවීම, ශරීරය ලැජ්ජාවට පත් කිරීම (body shaming), අන්තර්ජාලය තුළ දැඩි සුපරීක්ෂාකාරී වීමේ ප්‍රතිඵලයක් හෝ දරාගත නොහැකි යැයි සලකන මතයන්/ විශ්වාසයන් දක්වන යමෙකු වෙත ප්‍රහාරාත්මක වීම විය හැකි ය. ශ්‍රී ලාංකික සයිබර් අවකාශය තුළ මෙය සිදුවන සුලබ ආකාරයක් වන්නේ ස්ත්‍රීන්ගේ සහ ගැහැණු ළමුන්ගේ ඡායාරූප ද සමග ඔවුන්ව සම්බන්ධ කර ගත හැකි තොරතුරු (සහ ඇතැම් විට සේවාස්ථානයේ තොරතුරු) බෙදා හැරීමයි. මෙය බොහෝ විට කාන්තාව අසීරුවේ දමන, නින්දාවට පාත්‍ර කරන හෝ අපහාසාත්මක අවස්ථාවකට ඇය පත් කරන විස්තරයක් සමග මහජනතාවට ඇය ව සම්බන්ධ කර ගන්නා ආරාධනා කරමින් සිදු වේ. මෙම හිංසනය ස්ත්‍රියට/ ගැහැණු ළමයා ට අපකීර්තියක් වනවා සහ ඇය මානසික භ්‍රාන්තියකට පත් කරනවා පමණක් නොව ඇයව ලිංගික අපයෝජනයකට ද ලක් කිරීමකි.[24] කෙසේ නමුත් සමාජභාවය හෝ ලිංගික දිශානතිය නොසලකා ඕනෑම අයෙකුට ඩොක්සින් සිදුවිය හැකි බව මෙහිදී සඳහන් කළ යුතු ය. ඩොක්සින් හිදී සේවාස්ථානයේ සහ නිවසේ පෞද්ගලික විස්තර හා සෙසු පුද්ගලික තොරතුරු නිරාවරණය වන අතර, එමගින් වින්දිතයාව පහසුවෙන් සොයාගත හැකි වේ. එය වින්දිතයා හට කායික හිංසනයක් සහ කායික හානියක් සිදුකිරීම දක්වා යා හැක.

'අවුටින්' (Outing) යන්න ද සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) ප්‍රජාව ඉලක්ක කරගෙන සිදුවන ඩොක්සින් හි ප්‍රභේදයකි. යම් අයෙකුගේ ලිංගික දිශානතිය (නැඹුරුතාවය) සහ සමාජභාවී අනන්‍යතාවය ඇතැම් විට පුද්ගලික තොරතුරු ද සමග පළ කිරීම මෙයින් අදහස් වේ. ශ්‍රී ලංකාවේ සමරිසි ස්ත්‍රී, සමරිසි පුරුෂ, ද්වීරිසි, සංක්‍රාන්ති සමාජභාවී, අතික්‍රාන්ත (කුවියර) සහ අන්තර්ලිංගික (LGBTQI+) ප්‍රජාව කෙරෙහි පවතින සෘණාත්මක ආකල්ප හේතුවෙන් මෙමගින් බරපතළ ප්‍රතිවිපාක ඇති විය හැකි ය. ඔවුන් ට එරෙහිව ට්‍රාන්ස්ෆෝබික් (transphobic) සහ හෝමොෆෝබික් (homophobic) ප්‍රහාර එල්ල වීමට මෙමගින් තුඩු දිය හැකි ය.

## 3.4 සෙක්ස්ටෝෂන් (Sextortion)

ලිංගික වාසි, නිරුවත් ඡායාරූප, වීඩියෝ සහ මුදල් වැනි අපරාධකරු නිරන්තරයෙන් ඉල්ලා සිටින දේ වින්දිතයා විසින් සපයන්නේ නැති විට වින්දිතයාගේ අතිශය පුද්ගලික පින්තූර, වීඩියෝ සහ/හෝ සංවාද වැනි නමුත් මේවාට පමණක් සීමා නොවූ පෞද්ගලික, පුද්ගලමය සහ ඇතැම් විට වින්දිතයා ව අමාරුවේ හෙළන තොරතුරු මුදා හරින බවට අපරාධකරු විසින් මෙහිදී තර්ජනය කිරීම සිදු කරයි. සෙක්ස්ටෝෂන් සිදුකරන අපරාධකරු වින්දිතයාගේ පවුලේ, මිතුරන්ගේ, සේවකයන්ගේ හා සෙසු දන්නා අයගේ සමීප අන්තර්ගතයන් මුදා හරින බවට තර්ජනය කළ හැක. මෙහිදී වින්දිතයා අපකීර්තියට පත් කිරීම, ලැජ්ජාවට පත් කිරීම සහ වින්දිතයාගේ චරිතයට අපහාස කිරීම සිදුකරන බවට තර්ජනය කරයි. මෙවැන්නක අරමුණ වන්නේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) විසින් ඇති කරන භීතිය සහ පිළිකුළ (ස්ටිග්මා - stigma) සන්නද්ධකරණය කිරීම මගින් පවුල, සමාජය සහ ප්‍රජාව තුළ වින්දිතයා විසින් පවත්වාගෙන යන සම්බන්ධතා නැති වීමේ භීතිය ඇති කර වින්දිතයා ව තනි කිරීම සහ වින්දිතයා ව තමන්ට අවශ්‍ය ආකාරයට මෙහෙයවා ගැනීමයි.

[24] ඩොක්සින් හි සුලබ ආකාරයක් වන්නේ ස්ත්‍රියගේ දුරකථන අංකය සමග ඇගේ ඡායාරූපයක් පළ කරමින් ඇය ලිංගික ශ්‍රමිකයෙකු හෝ සම්බාහන සේවා සපයන්නියක ලෙස දක්වමින් ඇයගෙන් 'හමුවීම සඳහා වේලාවක්' ලබාගන්නා ලෙසට තැනැත්තන්ට ඇරයුම් කිරීමයි

## 3.5 ව්‍යාජ පැතිකඩ (Fake Profiles) සහ පුද්ගලානුරූඩය (Impersonation)

ඔන්ලයින් නිර්නාමිකත්වය දෙපැත්ත කැපෙන කඩුවකි. එය ප්‍රසිද්ධියේ පෙනී සිටීමට අකමැති සහ මාර්ග ගත ව සිය ඩිජිටල් සටහන තැබීමට අකමැති අයට ආරක්ෂිත තෝතැන්නක් විය හැකි  ය. නමුත් අවසනාවන්ත ලෙස, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සන්දර්භය තුළ ව්‍යාජ පැතිකඩ (ව්‍යාජ ප්‍රොෆයිල) නිර්මාණය සහ වෙනත් අය ලෙස පෙනී සිටීම හෙවත් පුද්ගලානුරූඩය (Impersonation) විසින් ශ්‍රී ලාංකික සයිබර් අවකාශය තුළ බරපතළ ලෙස ප්‍රශ්නකාරී රටාවක් ඉදිරිපත් කෙරේ.

මෙම රටාවන්ගේ වඩාත්ම සුලබ ආකාරයන්ට, වින්දිතයෙකුගේ ඡායාරූපය සහ/හෝ පුද්ගලික තොරතුරු භාවිතා කරමින් සමාජ මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රොෆයිල නිර්මාණය කිරීම සහ වින්දිතයන් ව මාර්ග ගත ව පුද්ගලානුරූඩයට ලක් කිරීම දැක්විය හැක. මෙහිදී මෙම තොරතුරු ලබාගන්නේ වින්දිතයාගේ සමාජ මාධ්‍ය ගිණුම් සෝදිසියට ලක් කිරීම හෝ සමීප සම්බන්ධතාවයක් හේතුවෙන් වින්දිතයාට දැනටමත් සමීප ව සිටින අපරාධකරු විසින් එවැනි ව්‍යාජ පැතිකඩක් නිර්මාණය කිරීමයි. ඉන්පසු අපරාධකරු විසින් වින්දිතයා ලෙස කටයුතු කිරීමත් වින්දිතයාගේ මිතුරන්ට සහ පවුලේ අයට මිතුරු ඉල්ලීම් යැවීමත් සිදු කරනු ඇත. ඔවුන් ව සිය ව්‍යාජ පැතිකඩට එකතු කර ගැනීමෙන් පසුව අපරාධකරු විසින් තමන් නිර්මාණය කළ අපහාසාත්මක අන්තර්ගතයන් බෙදා හැරීම මෙන්ම පුද්ගලික පින්තූර, සමීප ඡායාරූප සහ වින්දිතයාගේ වීඩියෝවන් බෙදා හැරීම සිදුකරනු ඇත්තේ නින්දාව, ලැජ්ජාව, චරිතයට අපහාස කිරීම සහ ඇතැම් විට වින්දිතයා ට සිය පවුල් හා මිතුරු සබඳකම් අහිමි කිරීමට මග පාදමිනි. තවද, ව්‍යාජ පැතිකඩ ට එක් වී සිටින මිතුරන්ගෙන් සහ පවුලේ අයගෙන් මුදල් ඉල්ලා සිටීම මගින් අපරාධකරු මූල්‍යමය වාසි ලබාගැනීමට ද තැත් කරනු ඇත. මෙකී ව්‍යාජ පැතිකඩ අතිශයින්ම අනුමැතියෙන් තොර සමීප පින්තූර/ ඡායාරූප (NCII) බෙදා හැරීම සහ, ඩොක්සින් හා මෝර්ෆින් වැනි ලිංගික සූරාකෑමේ වෙනත් ආකාරයන් සම්බන්ධයෙන් ද යොදා ගනු ඇත්තේ ඔන්ලයින් සහ ඕෆ්ලයින් යන දෙවර්ගයේම වගඋත්තර දායකත්වය (වගවීම) එලදායී ලෙස මග හරිමිනි.

ව්‍යාජ පැතිකඩෙහි තවත් මානයක් වන්නේ නිර්නාමික  ව සිටීමේ අරමුණ ඇතිව අපරාධකරු විසින් තනි පුද්ගලයෙකුගේ සමාජ මාධ්‍ය පිටු වල තිබෙන පින්තූර ඇසුරෙන් ව්‍යාජ පැතිකඩ නිර්මාණය කිරීමයි. මෙම ව්‍යාජ පැතිකඩ ඇතැම්විට පවතින්නේ එම පින්තූරවල හිමිකරු නොවන වෙනත් අයෙකුගේ නම යටතේ විය හැකි ය. මේ ආකාරයේ ව්‍යාජ පැතිකඩ නිර්මාණය කරන්නේ බොහෝ විට ළමුන්, යොවුන් වැඩිහිටියන් සහ කාන්තාවන් ලිංගිකමය ක්‍රියාවන් සඳහා පොළඹවා ගැනීමට සහ ඔවුන්ට බලපෑම් කිරීමට ය. මෙමගින් ඔවුන් ඔන්ලයින් සහ ඕෆ්ලයින් යන දෙවර්ගයේම ලිංගික අපයෝජනයට ලක් කිරීමට ඉඩ තිබේ. නිර්නාමික බවේ ආරක්ෂාව ගැන සිතමින් මෙම ව්‍යාජ පැතිකඩ බලහත්කාරයෙන් හෝ තර්ජනය කිරීම හරහා මුදල් ලබාගැනීමට ද පාවිච්චි කෙරේ.

# 4 මොඩියුලයේ අරමුණ

මෙම මොඩියුලය ඉහත සඳහන් කළ සන්දර්භය තුළ පිහිටා ඇති අතර තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වාර්තා කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වූ වත්මන් යාන්ත්‍රණ පිළිබඳ මාස 4ක තක්සේරුවකින් සිදුකිරීමෙන් පසුව සකස් කර තිබේ. මේ සඳහා පවතින යාන්ත්‍රණයේ තීරණාත්මක ආයතන වන රජයේ ප්‍රධාන නීති සාධන ආයතන හා  රාජ්‍ය නොවන සංවිධානවල කාර්යයන් ඉස්මතු කිරීමටත්, වින්දිතයන් යුක්තිය ට ප්‍රවේශ වීමේ ක්‍රියාවලියේ පවතින හිඩැස් හඳුනා ගැනීමටත් මෙමගින් අරමුණු කරයි.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වින්දිතභාවය සුවිශේෂී වශයෙන් සමාජභාවීකරණය වී ඇති හෙයින්, මෙම තක්සේරුවේ කේන්ද්‍රීය ප්‍රශ්නයක් වූයේ මෙම ආයතනවලට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන් සමාජභාවීකරණය වූ එළඹුමක්/ ප්‍රවේශයක්  තිබේ ද යන්නයි. එනම්, සංග්‍රහවගත කළ හෝ සවිඥානික පරිචයන් හරහා ක්‍රියාත්මක කරන සමාජභාවීය එළඹුමක් තිබේ ද යන්නයි. සමාජභාවී ප්‍රවේශයක් ලෙස එම  ආයතන තේරුම් ගෙන ඇත්තේ කුමක්ද, එවැනි ප්‍රවේශයක් සැලසුම් කිරීමේදී සලකා බැලූ කරුණු මොනවාද සහ ප්‍රවේශයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ඇති බාධක මොනවාද යන්න පිළිබඳවද විමර්ශනය කරන ලදී.

මෙම මොඩියුලයේ අනෙක් ඉලක්කය වන්නේ ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ඩිජිටල් සාක්ෂරතාවය සමාලෝචනය කිරීමයි. වැරදි භාවිතාවන් සිදුවන පදනම වන්නේ තාක්ෂණයයි. එබැවින්, ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ තාක්ෂණික විභවයන්  නංවාලීම සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වැළැක්වීමට සහ ප්‍රතිකර්ම යෙදීමට සෘජු බලපෑමක් ඇති කරනු ඇති. එමගින් ඔවුන් විසින් දක්වන ප්‍රතිචාර ද වැඩිදියුණු වේ. ස්ත්‍රීන් හෝ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත  තැනැත්තන් ඉලක්ක කරන වෛරී කථනය සමග ඔන්ලයින් පරිසරය කාන්තාවන්ට, ගැහැණු ළමයින්ට සහ ලිංගික දිශානතිය, සමාජභාවී අනන්‍යතාවය, සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ (SOGIESC) සහිත තැනැත්තන්ට අනාරක්ෂිත සහ අනතුරුදායක වී තිබේ. අපවාදාත්මක, පිළිකුල්සහගත සහ කෝපාන්විත වෛරී ප්‍රකාශයන් නිශ්චිත ජනවාර්ගික කණ්ඩායම් සහ ආගම් ඉලක්ක කර ගෙන කාන්තාවන් සහ ගැහැණු ළමයින් වෙත යොමු වන බව ද මතක තබා ගත යුතුය.

මෙම මොඩියුලය සූදානම් කිරීමේදී තාක්ෂණික සහාය, නීති ආධාර, මනෝ සමාජීය සහය සහ පර්යේෂණ සහ පුහුණුව ඇතුළු, නමුත් ඒවාට සීමා නොවී ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා ප්‍රතිචාර දක්වන ප්‍රධාන පාර්ශවකරුවන් හඳුනා ගැනීම සඳහා ශාස්ත්‍රීය පර්යේෂණක් සිදු කරන ලදී. මෙම මූලික සිතියම්කරණ අභ්‍යාසයෙන් පසුව, මෙම පාර්ශවකරුවන් සම්බන්ධ කරගනිමින් ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා දෙකක් පවත්වන ලදී. මෙම තොරතුරු විමසීම් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වලට ප්‍රතිචාර දැක්වීමේ මූලික යථාර්ථයන් සහ පවතින යාන්ත්‍රණයන්හි ප්‍රකාශිත හිඩැස් හඳුනා ගැනීම සඳහා විශේෂයෙන් උපකාරී විය.

## 4.1 ප්‍රධාන නිරීක්ෂණ

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) ට අනුයුක්ත පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) සියලු ආකාරයේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ඇතුළත් තාක්ෂණය සම්බන්ධ සහ සමාජ මාධ්‍ය ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රමුඛතම නීතිය ක්‍රියාත්මක කරන ආයතනය වේ.

ශ්‍රී ලංකා පොලිසියට අනුයුක්ත ළමා හා කාන්තා කාර්යාංශය ද නීති සාධන ආයතන තුළ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිදුවීම්වලට ප්‍රතිචාර දක්වන ප්‍රධාන ආයතනයකි. මෙය බොහෝ විට පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) සමඟ සමපාත ව කටයුතු කරයි. අන්තර්ජාලය හරහා සිදුවන ළමා ලිංගික සූරාකෑම සම්බන්ධයෙන් ද ළමා හා කාන්තා කාර්යාංශය ප්‍රතිචාර දක්වයි. ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (SGBV) සිදුවීම් වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා කැපවූ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ, රටේ පොලිස් කොට්ඨාශ 44 කින් සොයාගත හැකිය.

පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) සහ පොලිස් ළමා හා කාන්තා කාර්යාංශය හැරුණු විට, ප්‍රතිචාර දක්වන අංශය සිවිල් ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයකින් සමන්විත වන අතර, පර්යේෂණ, නීති ආධාර, සහාය සේවා, තාක්ෂණික සහාය ඇතුළු ක්ෂේත්‍රවල වැඩ කිරීම මෙන්ම නීතිය ක්‍රියාත්මක කරන්නන් සමඟ සෘජුව කටයුතු කිරීම ද ඔවුන් විසින් සිදුකරනු ලබයි.

## 4.2 ශාස්ත්‍රීය පර්යේෂණය

ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වන සංවිධාන සහ ආයතන සිතියම්ගත කිරීම සඳහා 2021 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මූලික ශාස්ත්‍රීය පර්යේෂණය සිදු කරන ලදී.

මෙම සිතියම්ගත කිරීමේ අභ්‍යාසය මගින් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ප්‍රතිචාර දැක්වීමේ විවිධ ආකාර කිහිපයක යෙදෙන ප්‍රධාන ආයතන 18ක් හඳුනා ගන්නා ලදී. දත්ත එක්රැස් කිරීම, ආයතනවල නියෝජිතයින්ගේ ප්‍රාථමික වශයෙන් සිදුකළ අතර, පොදු අවකාශයේ පවතින තොරතුරු මත පදනම් වූ ද්විතීයික පර්යේෂණ වලින් සිදුකරන ලදී

මෙහිදී එක් එක් සංවිධානය පිළිබඳ පහත තොරතුරු සැලකිල්ලට ගන්නා ලදී.

- එක් එක් සංවිධානයක් ප්‍රතිචාර දක්වන තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි ආකාර/ ප්‍රභේද,
- යොදාගනු ලබන ප්‍රතිචාර යාන්ත්‍රණ,
- තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිද්ධියකට ප්‍රතිචාර දක්වන ක්‍රියාවලිය,

- ඩිජිටල් සාක්ෂරතාව හා සමාජභාවය පිළිබඳ සංවේදීතාව ඇතුළුව, නමුත් ඒවාට සීමා නොවී ප්‍රතිචාර දක්වන්නන්/සේවකයින් සඳහා පුහුණුව හෝ විශේෂීකරණය ලබාදීම,
- දත්තවල රහස්‍යභාවය, සංරක්ෂණය සහ වාර්තා තබාගැනීම පිළිබඳ දැනුම,
- තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ප්‍රතිචාර දැක්වීමට සහ/හෝ යුක්තිය හා සහන සඳහා විධිමත් ක්‍රම අනුගමනය කිරීමට ඇති බාධක සහ භාෂා ධාරිතාව සහ ප්‍රවේශ්‍යතාව.

අනුමැතියෙන් තොරව සමීප ඡායාරූප (NCII)/වීඩියෝ බෙදාගැනීම, සයිබර් ලිංගික සූරාකෑම සහ අපයෝජනය, සෙක්ස්ටෝෂන් සහ අපයෝජනය, සහ සයිබර් හිංසන (සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) ඇතුළත් ව) ඔවුන්ට වැඩිපුරම හමුවන සහ ප්‍රතිචාර දක්වන තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි ප්‍රභේද ලෙස හඳුනා ගන්නා ලදී. තමන් ප්‍රතිචාර දැක්වූ සිද්ධි ලෙස තර්ජන ද සංවිධාන හතරක් ක් විසින් හඳුනා ගන්නා ලදී.

ප්‍රතිචාර යාන්ත්‍රණයන් සම්බන්ධයෙන්, වඩාත් බහුලව ලබා දෙන ප්‍රතිචාර යාන්ත්‍රණය නීති ආධාර විය. පැමිණිල්ලක් ගොනු කිරීම සහ පසු විපරම් කිරීම ඇතුළු නීතිමය ක්‍රියාවලියට අදාළව තවදුරටත් සහාය ලබා දුන් බව සංවිධාන 9 ක් තහවුරු කළේය.

වින්දිතයින් සඳහා තාක්ෂණික සහාය තමන් සතුව ඇති බව ද සංවිධාන නවයක් තහවුරු කළේය. සමාජ මාධ්‍ය යෙදුම්වල රහස්‍යතා සැකසීම් ගැළපීමට උදවු කිරීම, ඔවුන්ව පුද්ගලානුරූඩයට ලක් කිරීමට හෝ අපකීර්තියට පත් කිරීමට උත්සාහ කරන ව්‍යාජ පැතිකඩ අවහිර කිරීම සහ ඉවත් කිරීම සහ හානිකර අන්තර්ගතයන් ඉවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය සමාගම් වෙත පැමිණිලි ගෙන ඒම මෙයට ඇතුළත් විය. සිත්ගන්නා කරුණ නම්, මෙම සේවාවන් තුනම ලබා දුන්නේ ආයතන හතරක් පමණි.

ආයතන දාහතරකට සියලුම සේවාවන් සඳහා ත්‍රෛභාෂා ප්‍රවේශය ඇත. ආයතන 18 න් 9 ක්ම කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් එකක් හෝ කිහිපයක් සඳහා විධිමත් පුහුණුවක් ලබා දී ඇත: ඩිජිටල් සාක්ෂරතාව, සමාජභාවී සංවේදීකරණය සහ මනෝ සමාජීය ආධාර සැපයීම. කෙසේ වෙතත්, වින්දිතයින් සඳහා සිය ආයතනය ආශ්‍රිතව මනෝ සමාජීය ආධාර සැපයීමේ හැකියාව ඇත්තේ සංවිධාන 3කට පමණක් වන අතර, වින්දිතයින් එවැනි සේවාවන් සපයන බාහිර සංවිධාන වෙත යොමු කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කර ඇති බව එක් සංවිධානයක් ප්‍රකාශ කළේය.

බොහෝ ආයතන ඩිජිටල් ආරක්ෂාව සහ සමාජභාවී සංවේදීකරණය පිළිබඳ වැඩමුළු සහ පුහුණු වැඩසටහන් ද සපයා ඇති බව සඳහන් කිරීම සිත්ගන්නා කරුණකි. මෙයින් බහුතරයක් කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා සැපයූ අතර, නිතැතින්ම ඒවාට සහභාගී වී තිබුණේ ද ප්‍රධාන වශයෙන් කාන්තාවන් සහ ගැහැණු ළමුන් ය. යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් සහ වැන්දඹුවන් සමඟ දැනුවත්ව කටයුතු කළේ සමීක්ෂණයට ලක් කළ සංවිධානවලින් 1ක් පමණි.

## 4.3 ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා (FGDs)

ශාස්ත්‍රීය පර්යේෂණයෙන් පසුව, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ප්‍රතිචාර දැක්වීමේ කාර්යයයේ වත්මන් විෂය පථය පිළිබඳ වඩාත් ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමේ අරමුණින් කේන්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා (FGDs) දෙකක් පවත්වන ලදී. සමාජභාවීකරණය වූ එළැඹුමක්/ ප්‍රවේශයක් මෙහිදී අනුගමනය කරන්නේද යන්න හඳුනා ගැනීම අතිශය වැදගත් වූයේ, මෙම මොඩියුලයේ එම සංරචකය දැනුම් දීම සඳහා ආයතනවල ඩිජිටල් සාක්ෂරතාවයේ මූලික මිනුම ස්ථාපිත කිරීමට ඉක්න්ද්‍රීය කණ්ඩායම් සාකච්ඡා වැදගත් වන හෙයිනි.

## 4.3.1 ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 1 - මහජන ආයතන

ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) ඇතුළු නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ සිවිල් ආයතනවල නියෝජිතයන්ගෙන් පළමු ඉලක්කගත කණ්ඩායම සමන්විත විය. මෙම සාකච්ඡාවේ මූලික අරමුණ වූයේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සිදුවීම් සම්බන්ධයෙන් සයිබර් ආරක්ෂාව, කාන්තා හා ළමා කටයුතු සහ පරිගණක අපරාධ සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන රාජ්‍ය ආයතනවල ප්‍රවේශය පිළිබඳ තොරතුරු රැස් කිරීමයි.

ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වත්මන් තත්ත්වය පිළිබඳව නීතිය ක්‍රියාත්මක කිරීමේදී මෙම සාකච්ඡාව තුළින් ලබාගත් සියුම් අවබෝධය පහත පරිදි වේ.

- වාර්තා වූ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වඩාත් නිරන්තර ආකාරය වන්නේ සමීප පින්තූර සහ වීඩියෝ අනුමැතියෙන් තොරව බෙදා ගැනීමයි (NCII). සිද්ධි වැඩි ගණනකට සම්බන්ධ වූ අපරාධකරු සහ පැමිණිලිකරු, කලින් ප්‍රේම සම්බන්ධයක් හෝ ලිංගික සබඳතාවක් පැවැත්වූ අය වූහ. පළිගැනීමේ චේතනාව බොහෝ අවස්ථාවලදී පැවතුණි.

- මෙම පැමිණිලිවලින් බහුතරයකට වඩා සංවේදී අන්තර්ගතය, ලිංගික අනුග්‍රහය සහ මුදල් ඉල්ලා අපරාධකරු සමඟ තර්ජන සහ/හෝ ලිංගික අතවර කිරීමේ උත්සාහයන් ද ඇතුළත් විය. බොහෝ විට ඉල්ලා සිටින සහාය වූයේ වේදිකාවෙන් සම්මුතිවාදී රූප/වීඩියෝ/අන්තර්ගතය ඉවත් කිරීමයි.

- අතීත සහකරුවන් සම්බන්ධයෙන් වන සෙක්ස්ටෝෂන් සිද්ධිවලදී මූල්‍ය චේතනාවක් පැවතීම දුර්ලභ වූ අතර, අපරාධකරුවන් වාණිජ අසභ්‍ය වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය පිටු මත එවැනි අන්තර්ගතයන් විකිණීමත් සමඟ, එකඟ නොවන සමීප ද්‍රව්‍යවල මුදල් ඉපැයීම වේගයෙන් ඉහළ ගොස් තිබේ.

- පැමිණිලි ආශ්‍රිතව බරපතළ බයක් සහ පිළිකුළක් (ස්ටිග්මා) පැවතීම සහ වින්දිතයන්ට දොස් පැවරීම (victim-blaming) පැවතිණි. මෙය විශේෂයෙන්ම සිදුවූයේ ආසන්නතම පවුලේ අයගෙනි. කැමැත්තකින් තොරව සමීප අන්තර්ගතයන් බෙදාහැරීම සහ සෙක්ස්ටෝෂන් සිද්ධිවලදී මෙම තත්වය උග්‍ර විය.

- සුළු පැමිණිලිකරුවන් සම්බන්ධ සිද්ධිවලදී අවදානම්කාරී සතුරුකමක් ද පැහැදිලි වේ. අපරාධකරුවෙකු විසින් තමාට පිහියක් එල්ල කර, තමාගේ අනුමැතියෙන් තොරව ඡායාරූප ගත් බවට 13 හැවිරිදි ගැහැණු ළමයෙකු පැමිණිලි කළ අවස්ථාවක අත්දැකීම එක් ප්‍රතිචාර දක්වන්නෙක් බෙදාගත්තේය. කෙසේ වෙතත්, වැඩිදුර විමර්ශන වලදී හෙළිදරව් වූයේ ඇය ව දැන් සෙක්ස්ටෝෂන් වෙත ලක් කරන ඡායාරූප එම අපරාධකරු වෙත යවා ඇත්තේ ඇය විසින්ම ස්වේච්ඡාවෙන් බවයි. දෙමාපියන්ගෙන් තරවටුවට හෝ හෙළා දැකීමට ලක් වනු ඇතැයි බිය නිසා බාලවයස්කාර දැරිය සම්පූර්ණ සත්‍යය හෙළි කර නොතිබුණි. මෙම සිද්ධිය, ස්ටිග්මාව හෙවත් බිය සහ පිළිකුල් සහගත හැඟීම විසින් වින්දිතයන් සම්පූර්ණ වශයෙන් ඉදිරියට නොඒම විදහා දක්වන්නක් බව ප්‍රතිචාර දක්වන්නා නිරීක්ෂණය කළේය. මෙසේ ඔවුන් සම්පූර්ණයෙන් වැඩිදුර තොරතුරු හෙළි කිරීමට අසමත් වීම තුළ සමීප ජාලවලින් තවදුරටත් භ්‍රාන්තමය සැලකිලි ලැබීම වළක්වා ගැනීමට ද අසමත් වන්නේ, ඉන්පසු එමගින් විමර්ශන ක්‍රියාවලියට ද බාධා කරමිනි.

- තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ පවතින ප්‍රතිචාර යාන්ත්‍රණයන් පිළිබඳ නිදන්ගත ලෙසම අවබෝධයක් නොමැතිකම, විශේෂයෙන් ග්‍රාමීය ප්‍රදේශවල සහ කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත පවතියි. වින්දිතයා බාල වයස්කරුවෙකු නම්, දෙමාපියන්ගේ හෝ වැඩිහිටි භාරකරුගේ පැත්තෙන් ප්‍රතිචාර යාන්ත්‍රණයන් පිළිබඳ අවබෝධයක් නොමැතිකම හානිය අවම කිරීම සම්බන්ධයෙන් පසුබෑම් ඇති කරයි.

- නීතිය ක්‍රියාත්මක කරන ආයතන වෙත පැමිණිලි පැමිණි විට බොහෝ විට 'ප්‍රමාද වැඩි'ය. කොන් වේ යැයි බියෙන් ඉදිරිපත් වීමට ඇති අකමැත්ත සහ කළ යුතු දේ ගැන අවබෝධයක් නොමැතිකම මෙම ප්‍රමාදයන් සඳහා ප්‍රධාන සාධක වේ. එවැනි ප්‍රමාදයන් නිසා හෝ පැමිණිලිකරුවන් අහම්බෙන් මෙවලම/සාක්ෂිවලට හානි කිරීම නිසා මෙවලම්වලින් දත්ත සහ සාක්ෂි ලබා ගැනීමේ තාක්ෂණික දුෂ්කරතා ද පැන නගී.

- තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ව්‍යාප්තිය වසර ගණනාවක් පුරා ක්‍රමානුකූලව ඉහළ ගොස් තිබේ. වසර 2019 සහ 2020 අතර වූ කාලය (Covid-19 හේතුවෙන්) තුළ මෙය බොහෝ දුරට දැකගත හැකි වේ. වයස අවුරුදු 13 ත් 25 ත් අතර අය, බොහෝ විට ගැහැණු ළමයින් සහ කාන්තාවන්, වඩාත් අවදානමට ලක් වේ. වැඩිපුරම පැමිණිලි ලැබී ඇත්තේ පාසල් යන ළමුන්ගෙනි.

- රැකියා විරහිත, නිවසේ රැඳී සිටින කාන්තාවන් සහ සංක්‍රමණික සේවකයින්ගේ දරුවන් ද අධි අවදානම් කාණ්ඩ විය හැකි ය. දිවා කාලයේ ගෘහයේ වැඩි කාලයක් ගත කරන කාන්තාවන් සමාජ මාධ්‍යවල වැඩි කාලයක් ගත කිරීමට වැඩි ඉඩක් ඇති බවත්, බොහෝ විට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත් වය (TFSGBV) සහ මූල්‍ය වංචාවන්ට පවා ගොදුරු වන බවත් නිරීක්ෂණය විය.

- ප්‍රමාණවත් වැඩිහිටි අධීක්ෂණයක් නොමැතිකම සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ දරුවන්ට එරෙහිව තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි ඉහළ ව්‍යාප්තියට දායක වූ සාධක යක් විය. ප්‍රතිචාර දැක්වූවන් සඳහන් කළේ, මෙම දරුවන් බොහෝ විට ආච්චිලා සීයලා වැනි ද්විතීයික භාරකරු වන්ගේ රැකවරණයේ තබා ඇති අතර, ඔවුන්ගේ ඩිජිටල් ආරක්ෂාව සහ/හෝ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණයන් පිළිබඳ දැනුම අතිශයින් අඩු විය හැකි බවයි.

- Covid-19 කාලය තුළ පාසල් වසා දැමීම සහ සෞඛ්‍ය ප්‍රොටෝකෝලවලට අනුව සමාජගත කිරීම සඳහා පනවා ඇති සීමාවන් හේතුවෙන්, සයිබර් ආරක්ෂාව පිළිබඳ නිසි දැනුමකින් තොරව ළමයින් වැඩි කාලයක් අන්තර්ජාලයේ ගත කළහ. ඩිජිටල් ආරක්ෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිව පාසල් ආශ්‍රිත සන්නිවේදනය සඳහා වට්ස්ඇප් WhatsApp කණ්ඩායම් භාවිතා කිරීම සිදුවිය. මෙහිදී අනෙකුත් වැඩිහිටියන් දරුවන් ලෙස පෙනී සිටීම හෝ මෙම කණ්ඩායම් වෙත ප්‍රවේශ වීම මගින් සුවිශේෂී ගැටළුවක් ඇති කර තිබේ. අපරාධකරුවන් බාල වයස්කරුවන්ට හිරිහැර කිරීමට, බ්ලැක්මේල් කිරීමට සහ සෙක්ස්ටෝෂන් කිරීමට පවා භාවිතා කරන බාල වයස්කරුවන්ගේ සම්බන්ධතා, තොරතුරු සහ ඡායාරූප විවෘත මූලාශ්‍ර වලින් රැස් කරති.

- පිරිමි සහ පිරිමි ළමෝ ද තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වලට භාජනය වෙති. නමුත් ශ්‍රී ලංකාවේ එය අඩුවෙන් කතා කෙරේ. මෑත කාලයේ මතු වී ඇති විශේෂිත ප්‍රවණතාවක් වන්නේ කාන්තාවන් පුරුෂයන් සමඟ වීඩියෝ ඇමතුම් ඇතුළු ලිංගික සංවාද ආරම්භ කිරීම සහ පසුව පුරුෂයන් බ්ලැක්මේල් කිරීමට එම අන්තර්ගතයන් සෘජුව භාවිතා කිරීමයි.

- පරිපූර්ණ ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ කැමැත්ත පිළිබඳ අධ්‍යාපනය නොමැතිකම බාලවයස්කරුවන්ට සහ කාන්තාවන්ට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වලට ගොදුරු වීමේ වැඩි අවදානමක් ඇති කිරීමට දායක වේ. ඩිජිටල් මෙවලමකට ප්‍රවේශ වීමත් සමඟ නව යොවුන් වියේ ස්වාභාවික ලිංගික කුතුහලයේ සමගාමී බව බොහෝ විට සිදුවන්නේ ඩිජිටල් සාක්ෂරතාවය, සයිබර් ආරක්ෂාව සහ කැමැත්ත පිළිබඳ කිසිදු පුළුල් දැනුමක් නොමැතිව ය.

- විශේෂයෙන් වින්දිතයා බාල වයස්කරුවෙකු වන විට විපතට පත් පාර්ශ්වයේ සහ ඔවුන්ගේ පවුලේ අයගේ මානසික සහ චිත්තවේගීය යහපැවැත්ම ආරක්ෂා කිරීමේ වැදගත්කම ද ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කර තිබේ. සමාජභාවී සංවේදිතාවය පිළිබඳ පුහුණුවේ ඇති දුර්වලතා සහ මනෝ සමාජීය සේවාවන් සම්බන්ධයෙන් පවතින ප්‍රචණ්ඩකාරී ආකල්ප ක්‍රියාවට නැංවීම මෙමගින් දුෂ්කර කර ඇත. වින්දිතයන් භ්‍රාන්තියට පත් වීම වළක්වා ගැනීම සඳහා වඩාත් සමාජභාවය පිළිබඳ සංවේදී අධිකරණ ක්‍රියාවලියක අවශ්‍යතාවය ද මතු විය.

- දිවයින පුරා උපකාරක මධ්‍යස්ථාන තිබුණද, වාර්තා කිරීම සඳහා ප්‍රවේශවීමේ පහසුව තවමත් කොළඹින් පිටත සීමා වී තිබෙන්නේ, බොහෝ විට කාන්තාවන් සහ ගැහැණු ළමයින් වඩාත් අවදානමට ලක්විය හැකි නිශ්චිත ප්‍රදේශවලට බලපෑම් ඇති කරමිනි.

- ආයතනික දැනුම් පදනම සහ හැකියාවන් මෑත කාලයේ ප්‍රගතියක් ලබා ඇති අතර, සයිබර් අපරාධ, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ නීතිමය සන්දර්භය පිළිබඳ පුළුල් අවබෝධයක් තවමත් කොළඹින් පිටත පොලිස් ස්ථාන තුළ සහ රාජ්‍ය ආයතනවල ශාඛා තුළ නොපවතින බව ට එකඟතාවයක් මතු විය.

- ඵලදායී ප්‍රතිචාර සහතික කිරීම සඳහා වූ තවත් බාධක අතරට විශේෂඥයන් ප්‍රමාණවත් නොවීම (තොරතුරු පද්ධති සහ වෝහාරික විගණනය වැනි ක්ෂේත්‍ර සඳහා) සහ වෝහාරික දත්ත පිළිබඳ අධිකරණ නිලධාරීන් සහ අධිකරණ පද්ධති අතර ඇති දැනුමේ ඌනතාව ඇතුළත් විය. නීතිය ක්‍රියාත්මක කිරීමට සහ අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා පවතින අද දිනයට ගැළපෙන  තාක්ෂණය සහ මෙවලම් නොමැතිකම ද සැලකිය යුතු බාධකයක් විය.

- මහජන ප්‍රවේශ ඇමතුම් මධ්‍යස්ථානවල සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා නම් කර ඇති ක්ෂණික ඇමතුම් මධ්‍යස්ථානවල පැමිණිලි හැසිරවීමට යොදවා ඇති පුද්ගලයින් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීය. ආයතන අතර සම්බන්ධීකරණය සහ සන්නිවේදන පරතරය තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිද්ධීන් සඳහා ඵලදායී, විධිමත් ප්‍රතිචාර සහතික කිරීම සඳහා බාධකයක් ලෙස ද හඳුනාගෙන ඇත. තවද, වාර්තාකරණයේ සහ ප්‍රතිචාර දැක්වීමේ නව ක්‍රම පිළිබඳව දැනුවත් භාවයක් නොමැතිකම ද වින්දිතයින්ට යුක්තිය ලබා ගැනීම කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරයි.

## සමාජභාවී ප්‍රවේශය

ප්‍රතිචාර දැක්වූවන් සිටි මතය වූයේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ගොදුරු වීමට බොහෝ දුරට ඉඩ ඇත්තේ තරුණ ගැහැණු ළමයින් සහ කාන්තාවන් බවයි. මෙහිදී වින්දිතයන්ට දොස් පැවරීමේ සංස්කෘතිය අතිශයින් පැතිර පවත්නා බව ද ඔවුහු නිරීක්ෂණය කළහ. මෙය ඔවුන් වෙත ගෙන එන සිද්ධි සම්බන්ධයෙන් ගන්නා එළැඹුමට බලපාන ආකාරය පිළිබඳ විමසීමේදී නීති ක්‍රියාත්මක කරන්නන් පෙන්වා දුන්නේ ඔන්ලයින් (මාර්ගගත) පැමිණිලි සේවාව මෑතකදී ස්ථාපිත කර ඇති බවයි.

වින්දිතයින්ට පුද්ගලිකව පොලිස් ස්ථානයකට ගොස් පැමිණිල්ලක් සටහන් කර ගැනීමේ අවශ්‍යතාවය මෙයින් සමනය කරන බව ඔවුහු සඳහන් කළහ. පොලිස් ස්ථානයකට පුද්ගලිකව ගොස් පැමිණිල්ල සටහන් කරවීමේ ක්‍රියාවලිය දුෂ්කර, බිය උපදවන සහ සමහර විට භ්‍රාන්තිය ගෙනදෙනසුලු විය හැකිය. තදබදය අවම කිරීම සඳහා පැමිණිල්ල මෙහෙයවීමේ පසුකාලීන අභ්‍යන්තර ක්‍රියාවලිය විධිමත් කර තිබේ. මෙම සේවාව භාෂා තුනෙන්ම ලබා ගත හැකි අතර පැමිණිලිකරුවන් ප්‍රාදේශීය පොලිස් ස්ථානය මගින් ඉදිරි පියවර වෙත යොමු කරනු ඇත. නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම විකල්පයක් වන අතර, මෙම ඔන්ලයින් සිද්ධීන් සුදුසු අධිකාරිය වෙත යොමු කෙරෙන අතර අවශ්‍ය අවස්ථාවලදී මූලික තාක්ෂණික සහාය ලබා දීමට අදාළ පොලිස් ස්ථානයේ තොරතුරු තාක්ෂණ මේසයට දැනුම් දෙනු ලැබේ.

## 4.3.2 ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාව 2 - සිවිල් සමාජය

දෙවැනි ඉලක්කගත කණ්ඩායම, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත සුවිශේෂී ලෙස ප්‍රතිචාර දක්වන රාජ්‍ය නොවන සිවිල් සමාජ සංවිධාන වලින් සමන්විත විය. පුළුල් වශයෙන් ගත් කල, මෙම සංවිධාන විසින් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වින්දිතයින්ට නීති ආධාර, පොලිස් වාර්තාකරණයේ සහාය, තාක්ෂණික සහාය සහ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළු සේවාවන් රාශියක් සපයනු ලැබේ.

මූලික සාකච්ඡා මගින් ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වත්මන් සන්දර්භය සම්බන්ධයෙන් පහත කරුණු තහවුරු විය.

- අනුමැතියෙන් තොරව සමීප රූප බෙදා ගැනීම (NCII) තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි බහුලවම වාර්තා වූ ආකාරය විය. අපරාධකරු බොහෝ විට පුරුෂයෙක්, අතීත සහකරුවෙක් හෝ රැවටිලිකාර පෙම්වතෙක් වන අතර, ඔහු පළිගැනීමේ චේතනාවක් ඇති, සහ/ හෝ වින්දිතයාට කීර්ති නාමයට හානි සිදු කිරීමේ චේතනාවකින් යුතු විය. සාමාන්‍යයෙන් වැඩිපුර ද්‍රව්‍යමය හෝ ලිංගික අනුග්‍රහයන් ඉල්ලා සෙක්ස්ටෝෂන් ද සිදුකළ හැකිය.

- කීර්ති නාමයට හානි කිරීමට සහ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට හිරිහැර කිරීමට ෆේස්බුක් හි ව්‍යාජ පැතිකඩ නිර්මාණය කිරීම මෑත කාලයේ වැඩි වෙමින් පවතී. මෙය ඇතැම් සිද්ධිවලදී සයිබර් ස්ටෝකින් (cyberstalking) හෙවත් සයිබර් අවකාශය තුළ ලුහුබැඳීම වෙත ළඟා වී තිබෙන්නේ අලුත් පැතිකඩ දිගින් දිගට බිහි කරමින් සහ හිංසනයේ නොනවතින දිගුවක් ඇති කරමිනි. මෙවැනි ව්‍යාපෘතිවලට සෙක්ස්ටෝෂන් සහ වින්දිතයා ට එරෙහි තර්ජන ද ඇතුළත් විය හැකිය.

- ඕෆ්ලයින් අවකාශයේ එකඟ නොවීම් සහ ලිංගික හිංසන, හිංසනයේ ඔන්ලයින් ව්‍යාපෘතියක් ලෙස විද්‍යාමාන විය හැකිය. තවද, සේවාස්ථානයේ ලිංගික අනුග්‍රහයන් සඳහා වූ ඕෆ්ලයින් උත්සාහයන් නිෂ්ඵල වූ විට පිරිමි සගයන් බොහෝ විට ව්‍යාජ පැතිකඩ භාවිතා කරමින් එවැනි සයිබර් හිරිහැරවලට යොමු වන සිදුවීම් වාර්තා වී ඇත.

- කාන්තාවන් සහ ගැහැණු ළමයින් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වල අවදානමට වඩාත් ලක් වේ. ස්මාට් ජංගම දුරකථන සඳහා වැඩි ප්‍රවේශය සහ ඩිජිටල් සාක්ෂරතා අධ්‍යාපනය අතර පවතින විෂමතාවය හේතුවෙන් ගැහැණු ළමයින් සහ නව යොවුන් වියේ දරුවන් මෙයට විශේෂයෙන් ගොදුරු විය.

- ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ සංස්කෘතික ස්ටිග්මාව (බිය හා පිළිකුළ) සහ සයිබර් අවකාශය භාවිතා කරන කාන්තාවන් සහ ගැහැණු ළමයින් පිළිබඳ ලිංගික සංකල්ප භයානක ආකාරයකින් ඒකාබද්ධ වේ. තමන්ට එරෙහිව කරන ලද ප්‍රචණ්ඩත්වය පිළිබඳ ඔවුන්ට මහත් ලැජ්ජාවක් දැනෙන අතර, මිතුරන් සහ පවුලේ අය එය දැන ගනීවි යන බියට ඔවුහු පත් වෙති. දෙමාපියන් විසින් සොයාගනීවි යන බිය විශේෂයෙන්ම ළාබාල ස්ත්‍රීන් සහ ගැහැණු ළමුන් අතර තීව්‍ර වන්නේ ප්‍රජාවන්ගෙන් සහ ආධාරක ජාලයන්ගෙන් සිදුවිය හැකි පළිගැනීම් සහ නෙරපා හැරීමට ලක් වීමේ බිය හේතුවෙනි.

- හදිසි ක්ෂණික දුරකථන ඇමතුම් සේවා තිබුණත්, මේවා හරහා සේවාවන් ලබා ගැනීම සමහරුන්ට දුෂ්කර බව ඔප්පු වී ඇත. රාජ්‍ය ආයතනවලට සතුටුදායක පිළියම් හෝ උපදෙස් ලබාදීමට අපොහොසත් වූ විට බොහෝ වින්දිතයෝ සිවිල් සමාජ සංවිධාන වෙත පැමිණෙති.

- බොහෝ වින්දිතයින් ඔවුන් ඉලක්ක කරන අන්තර්ගතය ඉවත් කිරීමට සහාය පතන අතර, නීති උපදෙස් සඳහා ඇති ඉල්ලුම ඉහළ මට්ටමක පවතී. එසේ තිබියදීත්, වින්දිතයින් අපරාධකරුවන්ට එරෙහිව විධිමත් නීතිමය ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට හෝ නීතිය ක්‍රියාත්මක කිරීම හරහා යම් ආකාරයක සහනයක් ලබා ගැනීමට අතිශයින් මැලි වෙති. පැමිණිල්ලක් දැමීම වෙහෙසකර ක්‍රියාවලියක් ලෙස සැලකේ. මෙම හැඟීම ඇති වන්නේ ධනාත්මක ප්‍රතිඵලයක් නොලද පොලිසිය සමඟ ඇති පූර්ව අත්දැකීමක් හේතුවෙනි. එක් ප්‍රතිචාර දක්වන්නෙක් මෙවැනි අත්දැකීමක් බෙදාගත්තේ මෙසේ ය.

> "සයිබර් හිංසන සිද්ධියක් සම්බන්ධයෙන් මම පුද්ගලිකව ගොස් පැමිණිල්ලක් ගොනු කළා. මගෙන් ප්‍රකාශයක් සටහන් කර ගැනීම සඳහා මාව කැඳවීමට ඔවුන් මාස 2 ක පමණ කාලයක් ගත්තා. ඉන්පසු මට හමු වූ පළමු නිලධාරියා මට කීවේ, මගේ සිද්ධියට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නිෂ්ඵල කාර්යයක් විය හැකි බවයි. මේ සියල්ලත් සමග මගේ ප්‍රකාශය සටහන් කර ගැනීම ඇතුළත් ව සම්පූර්ණ ක්‍රියාවලියට පැය 5 ක් ගත වුණා. අන්තිමට ඒ ප්‍රකාශය අත්සන් කළ යුතු ද කියාවත් මට විශ්වාසයක් තිබුණේ නැහැ."

- සයිබර් අපරාධ සහ සයිබර් හිරිහැර සම්බන්ධයෙන් අදාළ වන නීති පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් නොමැතිකම නිසාද පොලිසිය එවැනි සිදුවීම් විභාග කිරීමට මැලිකමක් දක්වන බව ප්‍රතිචාර දැක්වූවෝ සඳහන් කළහ.

- සමහර සංවිධාන වින්දිතයන් සමඟ පැමිණිල්ලක් ගොනු කිරීම වැනි ක්‍රියා පටිපාටි සඳහා පොලිස් ස්ථානයට ගිය අතර, නීතීඥයෙකු සිටීමෙන් පොලිසිය පැමිණිලිකරුට ලැබෙන සහ ප්‍රතිචාර දක්වන ආකාරය වැඩිදියුණු කරන බව සඳහන් කළහ. මෙය දිගින් දිගටම සිදු කිරීම මගින් ප්‍රශ්නය පරීක්ෂණ අදියරේදී විසඳා ගනිමින් දික් ගැස්සෙන ප්‍රමාදය වළක්වා ගැනීමට උත්සාහ කෙරිණි.

- නීතිය බලාත්මක කිරීමේ කඩිනම් ක්‍රියාමාර්ග නොමැතිකම නිසා, බොහෝ කාන්තාවෝ සහ ගැහැණු ළමෝ හිරිහැර වළක්වා ගැනීමේ ස්වයං වාරණයකට හෝ ඔවුන්ගේ දුරකථන ක්‍රියා විරහිත කිරීමට හෝ යොමු වෙති. මෙයින් පෙන්නුම් කරන්නේ වත්මන් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ප්‍රතිචාර මාර්ගයේ බරපතළ පරතරයක් ඇති අතර එය කාන්තාවන් සහ ගැහැණු ළමයින් නිහඬ කිරීමට බලාත්මක ලෙස මග පාදන බවයි.

- සයිබර් වැරදි සම්බන්ධයෙන් පොලිසියට පැමිණීමට ඇති මැලිකම පිරිමි සහ ගැහැණු යන දෙඅංශය ම අත්විඳින බව ප්‍රතිචාර දැක්වූවෝ සඳහන් කළහ. තමන් මත පනවා ගෙන ඇති පීතෘමූලික සම්මතයන් හේතුවෙන් පුරුෂයන් මේවා වාර්තා කිරීමට වැඩි මැලිකමක් දක්වනවා විය හැකි බව ද ඇතැම්හු සඳහන් කළහ.

## සමාජභාවී ප්‍රවේශය

> "..ඔවුන්ට තිබෙන බය තමයි, මිනිස්සු දොස් කියයි කියන එක. අනෙක් බිය තමයි, තමන්ට සිද්ධ වුණු දේ හෙළිදරව් කළොත් ඔවුන් නැවත වරක් වින්දිතභාවයට පත් වේවි හෝ අනෙක් අය තමන් ව පාවිච්චි කරාවි කියන බය. මේ වගේ අප්‍රසන්න අත්දැකීමකට සමාජය සාමාන්‍යයෙන් ප්‍රතික්‍රියා දක්වන විදිහ නිසා ලැජ්ජාවත් පවතිනවා. අපි සමාජය දැනුවත් කරන්න ඕනෙ, මේ වගේ උගුල්වලට අහු වෙන්න එපා සහ සමාජ මාධ්‍ය පරිස්සමෙන් පරිහරණය කරන්නෙ කොහොමද කියන කාරණා ගැන."

තාක්ෂණය සමඟ බැඳී ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ප්‍රතිචාර දැක්වීමේදී ඔවුන්ගේ සංවිධාන සමාජභාවී ප්‍රවේශයක් අනුගමනය කරන්නේ දැයි සාමාජිකයින්ගෙන් විමසූ විට, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් එය එසේ වන බව දක්වන සියුම් නිරීක්ෂණ ලබා දුන්හ. දැනුවත් භාවයෙන් යුතුව පැවසූ සුවිශේෂී පියවර සහ සැලකීමට ලක් කරන කාරණා අතර,

- බොහෝ විට තාක්ෂණය සමඟ බැඳී ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වලට ගොදුරු වූයේ කාන්තාවන් සහ ගැහැණු ළමයින් ය.
- ලිංගික ප්‍රචණ්ඩත්වය සහ වින්දිතභාවය පිළිබඳ සංස්කෘතික ආකල්ප බොහෝ විට වින්දිතයින්ගේ ස්ටිග්මාව (ලැජ්ජාව සහ අපකීර්තිය) අභ්‍යන්තරීකරණය කිරීමට හේතු වේ, සහ
- සයිබර් ලිංගික ප්‍රචණ්ඩත්වය, ඩිජිටල් සාක්ෂරතාවය සහ නිශ්චිත නීති පිළිබඳ දැනුවත්භාවය අඩුකම නිසා වින්දිතයින් ප්‍රතිචාර අංශවල හිඩැස් අතරින් ඇද වැටීමේ අවදානමක් ඇත.

එනිසා, සමාජභාවීමය එළැඹුමක්/ ප්‍රවේශයක් සමන්විත වූයේ :

- විධිමත් නීතිමය ක්‍රියාවලියකට යොමුවීමේදී කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට නීති උපදෙස් සහ නීතිමය නියෝජනයක් වශයෙන් ආධාර සැපයීම. මෙයට පොලිස් ස්ථානයකට පැමිණෙන වින්දිතයන් කැටුව යාම, සංවේදී පැමිණිලි ක්‍රියාවලීන් වෙනුවෙන් පෙනී සිටීම සහ නීතිය ක්‍රියාත්මක කරන්නන් සමඟ කම්පනයට පත් විය හැකි අන්තර්ක්‍රියා තවදුරටත් අවම කිරීම සඳහා වින්දිතයා වෙනුවෙන් පැමිණිලි ගොනු කිරීම ඇතුළත් වේ.

- තාක්ෂණය සමඟ බැඳී ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිළිබඳ අත්දැකීම් සමඟ ඉදිරියට පැමිණීමට කාන්තාවන් සහ ගැහැණු ළමයින් දිරිමත් කිරීම කෙරෙහි දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී අවධානය යොමු කර ඇත. තාක්ෂණය සමඟ බැඳී ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත ප්‍රතිචාර දැක්වීමට හැකි මාර්ග සහ පවතින සම්පත් පිළිබඳ තොරතුරු මෙයට ඇතුළත් වේ. ස්වයං වාරණය වෙනුවට පැමිණිලි ඉදිරිපත් කිරීමට කාන්තාවන් දිරිමත් කිරීම සහ සවිබල ගැන්වීම සඳහා වූ සංකීර්ණ සන්දර්භය පිළිබඳ දැනුවත් වී සමාජභාවීමය එළැඹුමක් ද මෙහිදී සටහන් විය.

- සයිබර් අවකාශයේ සිදුවන ලිංගිකමය හා සමාජභාවය පදනම් කර ගත් ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන් වැඩ කරන පොලිසිය සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල සමාජභාවී සංවේදීකරණ පුහුණුව සඳහා ක්‍රියාකාරීව පෙනී සිටීම. එක් ප්‍රතිචාර දක්වන්නෙකු විසින් තාක්ෂණය සමඟ බැඳී ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි පැමිණිල්ලකට කාන්තා පොලිස් කොස්තාපල්වරියක් ඉක්මනින් හා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වූ ධනාත්මක සිදුවීමක් සඳහන් කර ඇති අතර, මෙම ප්‍රතිචාර ක්‍රියාදාමයේ ප්‍රධාන ක්‍රියාකාරිකයෙකු ලෙස පොලිසිය පිළිගැනීම අවශ්‍ය බව එහිදී අනුමාන කෙරිණි.

- වඩා හොඳ සමාජභාවීමය දැනුවත් බවක් ඇති අනෙකුත් සිවිල් සමාජ සංවිධානවල සහාය සහ උපදෙස් ලබා ගැනීම. වින්දිතයන්ගේ දුක්ඛිත තත්වය ගැන සංවේදීව සිටින අතරම ඔවුන්ට උපකාර කිරීමට මෙය ප්‍රයෝජනවත් බව ඔප්පු වී තිබේ.

# 5 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා වන ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණ

## 5.1 පසුබිම

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට (TFSGBV) අදාළ බොහෝ පැමිණිලි පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) වෙත යොමු කෙරෙන්නේ සයිබර් අපරාධ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ මූලික අධිකාරි බලය ඇත්තේ ඔවුන් හට වීම නිසා ය. යම් අවස්ථාවල, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට ද මෙම පැමිණිලි පිළිබඳ කටයුතු කිරීමේ හැකියාව ඇත. මීට අමතරව, ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT), කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) වෙත ලැබෙණ පැමිණිලි, ඉහත සඳහන් ආයතන දෙක වෙත යොමු කෙරේ.

පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) උප ඒකක කිහිපයකට බෙදේ. ඒවායින් කිහිපයක් නම්:

- සමාජ මාධ්‍ය ඒකකය
- සමාජ මාධ්‍ය විමර්ශන ඒකකය
- බුද්ධි තොරතුරු හා සෝදිසි ඒකකය

පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසයේ (CCID) කොළඹ පිහිටි මූලස්ථානයට අමතරව, අම්පාර, නුවර සහ මාතර යන දිස්ත්‍රික්ක වල ඔවුන්ගේ ප්‍රාදේශීය ඒකක පිහිටා ඇත.

## 5.2 ද්වි කොටස් ප්‍රවේශය

ෂෝන්බෙක්, හයිම්සන් සහ නකමුරා (2020)[25] විසින් සමාජ මාධ්‍ය වේදිකාවලදී සිදුවන මෙබඳු අන්තර්ජාල හිරිහැර සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) අවම කර ගැනීමට භාවිතා කළ හැකි ඔන්ලයින් පාලන මෙවලම් දෙකක් පිළිබඳ කතා කරයි. එනම්,

1) ඉහළ සිට පහළට ප්‍රවේශය (Top-down approach): මෙම ප්‍රවේශය තුළ ඩිජිටල් වේදිකාව විසින්ම මාර්ගගත (ඔන්ලයින්) හිරිහැර කිරීම් සහ ප්‍රකාශනය කළ හැකි අන්තර්ගත වර්ගය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සහ රාමුව සකස් කර සකස් කරයි;

2) පහළ සිට ඉහළට ප්‍රවේශය: මෙම ප්‍රවේශයේදී, පරිශීලකයන් විසින්ම ප්‍රකාශනය කළ හැකි හැසිරීම් සහ අන්තර්ගතයේ පරාමිතීන් සම්බන්ධයෙන් වේදිකාව නවීකරණය කරයි. ඔවුන් පළ කරන ලද අන්තර්ගතය පිළිබඳව සුපරීක්ෂාකාරී වන අතර තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ඇතුළත් වන ඕනෑම අන්තර්ගතයක් පිළිබඳව වාර්තා කරයි.

---

[25] ෂෝන්බෙක් එස්., හෙයිම්සන්, ඕ. එල්., නකමුරා, එල්. (2021). Drawing from justice theories to support targets of online harassment. New Media & Society, 23(5), 1278–1300. https://doi.org/10.1177/1461444820913122


බොහෝ පරිශීලකයින් ට නිසගයෙන්ම හැඟී යන්නේ අන්තර්ජාල වේදිකා පාලනයට ලක් කළ ඒවා විය යුතු බව සහ ඒවායේ අන්තර්ගයන් පාලනය කළ යුතු බවයි. නමුත් බොහෝ විට එය එසේ නොවේ. පිටුවේ ඉහළට යන අන්තර්ගතය පරිශීලකයන්ට නවීකරණය කළ හැකි රෙඩ්ඩිට් (Reddit) මෙන් නොව, ෆේස්බුක් (Facebook) සහ ඉන්ස්ටග්‍රෑම් (Instagram) හි අන්තර්ගතය ප්‍රජා මාර්ගෝපදේශවලට අනුකූලද නැද්ද යන්න පරීක්ෂා කිරීමට ඔවුන්ගේම පරිපාලක කණ්ඩායම් සිටියි. මෙහිදී ඔබ විසින් යම් අන්තර්ගතයක් විශේෂයෙන් අන්තර්ගතය වාර්තා කරන්නේ නම් මිස, එය ඔවුන්ගේ ඇල්ගොරිතමයට හසු නොවන්නේ නම් එය පරීක්ෂාවට ලක් නොවනු ඇත. හිරිහැර කිරීම් අන්තර්ගතයන් නිර්මාණය කරන පරිශීලකයින් දැනුවත් කිරීම, අනුකම්පා කිරීම, ලැජ්ජාවට පත් කිරීම සහ අවහිර කිරීම වැනි උපාය මාර්ග, පහළ සිට ඉහළට යන ප්‍රවේශය මත රඳා පවතින වේදිකා හරහා පිටුවේ අන්තර්ගත යාමනය කරන්නන් (පරිපාලකයන්) විසින් බලාත්මක කරනු ලබයි. එමඟින් එම වේදිකාව, සෙසු පරිශීලකයන් සඳහා ආරක්ෂිත තැනක් බවට පත් කරනු ලැබේ.

## 5.3 ෆේස්බුක් (Facebook), ඉන්ස්ටග්‍රෑම් (Instagram) සහ යූ ටියුබ් (YouTube) විසින් ඔවුන්ගේ වේදිකාවන් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන්ගෙන් (TFSGBV) ආරක්ෂා කිරීම සඳහා යොදගන්නා වාර්තාකරණ මෙවලම් සලකා බලමු.


### 5.3.1 ෆේස්බුක් - Facebook

පසුගිය වසර කිහිපය තුළ ෆේස්බුක් කණ්ඩායම ඔවුන්ගේ පරිශීලකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ව්‍යාජ පැතිකඩ මැඩලීමට කටයුතු කර තිබේ. හානිකර අන්තර්ගතයන් හෝ පැතිකඩ අවහිර කිරීම සඳහා ඔවුන්ගේ ඇල්ගොරිතම නිර්මාණය කර තිබේ. නමුත් මෙහිදී ඇතැම් අවස්ථාවල බොට්ස් (bots) තාක්ෂණය විසින් නිශ්චිත තොරතුරු සම්පූර්ණයෙන් ග්‍රහණය කර නොගන්නා බැවින් මෙය මගහැරීමට පුළුවන. මේ හේතුවෙන්, පරිශීලකයින්ට ෆෙස්බුක් හි පැතිකඩ, පළ කිරීම්, අදහස් සහ වෙනත් ආකාරයේ අන්තර්ගතයන් තමන් විසින් ම වාර්තා කළ හැකිය.


ෆේස්බුක් හි වාර්තාකරණය සිදුකරන්නේ කෙසේද?


To report a profile:

1. Go to the profile that you want to report by clicking its name in your Feed or searching for it.
2. Click [...] to the right and select **Find support or report profile.**
3. To give feedback, click the option that best describes how this profile goes against our Community Standards, then click **Next.**
4. Depending on your feedback, you may then be able to submit a report to Meta. For some types of content, we don't ask you to submit a report, but we use your feedback to help our systems learn. Click **Done.**


To report a post:

1. Go to the post that you want to report.
2. Click ••• in the top right of the post.
3. Click **Find support or report post**.
4. To give feedback, click the option that best describes how this post goes against our Community Standards. Click **Next**.
5. Depending on your feedback, you may then be able to submit a report to Meta. For some types of content, we don't ask you to submit a report, but we use your feedback to help our systems learn. Click **Done**.





ෆේස්බුක් (Facebook) උපකාරක මධ්‍යස්ථානයේ සපයා ඇති ක්‍රියාවලියට අනුව අන්තර්ගතය හෝ පැතිකඩ වාර්තා කරන්නේ කෙසේද යන්න ඉහත රූප දෙක පැහැදිලි කරයි. මෙවලම වෙත තවදුරටත් යන විට, ෆේස්බුක් (Facebook) විසින් පරිශීලකයකුට වාර්තාවක් ඉදිරිපත් කළ හැකි කාණ්ඩ ලැයිස්තුවක් ඉදිරිපත් කරයි.

සාක්ෂි ළඟ තබා ගැනීම: ඉහත දක්වා ඇති ෆේස්බුක් (Facebook) වාර්තාකරණ පද්ධතිවලට අදාළව, ඔබේ වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර හිංසනයට මූලාශ්‍ර වූ අන්තර්ගතය හෝ පැතිකඩ පිළිබඳ සාක්ෂි, ඡායාරූපයක්/තිර රූපයක් (screen-shot) ආකාරයෙන් තබා ගැනීම වඩාත් සුදුසුය.

## 5.3.2 ඉන්ස්ටග්‍රෑම් - Instagram

මෙටා (Meta) සමාගම් සන්නාමය යටතේ පවතින තවත් වේදිකාවක් වන ඉන්ස්ටග්‍රෑම් (Instagram), ෆේස්බුක් (Facebook) මෙන්ම වාර්තාකරණ මෙවලමක් භාවිතා කරයි. මෙහි ඇල්ගොරිතම නිර්මාණය කර ඇත්තේ වැරදි අන්තර්ගතය සහ ව්‍යාජ පැතිකඩ ඉවත් කිරීමට වුවද, මෙහිදී ද බොට්ස් තාක්ෂණයට එය මග හැරී යා හැකිය. එබැවින් පැතිකඩ සහ අන්තර්ගතය පරිශීලකයන් ට තමන් විසින් අවහිර කළ හැකි වේ. ඉන්ස්ටග්‍රෑම් එහි පරිශීලකයින්ට පැතිකඩ සහ පුද්ගලයෙකු විසින් නිර්මාණය කළ හැකි හෝ දැනටමත් නිර්මාණය කර ඇති අනාගත පැතිකඩ අවහිර කිරීමට ඉඩ දීමෙන් ඉහළ මට්ටමක් පවත්වා ගනියි.



Instagram

How can we help?

Help Centre

- Instagram Features
- Manage Your Account
- Privacy, Safety and Security
- Policies and Reporting
- Instagram for Businesses

**Report Violations of our Community Guidelines**

Please use this form to report content (ex: photos, videos) on Instagram that violates our Community Guidelines. When you report something, your information isn't shared with the person whose post or profile you're reporting.

Do you have an Instagram account?

- Yes
- No

Where does the violation that you're reporting appear?

- Photo or video
- Comment
- An entire profile

How is this photo or video violating our guidelines?

- Nudity or pornography
- Violence or drug abuse
- Self-harm or suicide

Click here if you wish to report harassment or bullying.

Your Instagram username (if applicable):

To find your username, we suggest using the web browser version of our site (instagram.com/[username])

Your email address:

Username of the person who posted the content that you are reporting:


Full name of the person who posted the content as listed on their account (optional):

Link(s) to the specific photo(s), violating profile(s), stories or comment(s) you're reporting

Do you know this person in real life? If so, please provide as much contact information for this person as possible.

Additional information:

Send



**There are multiple ways to report something or someone on the Instagram app for Android and iPhone:**


Report a post through feed

1. Tap ••• (iPhone) or ⋮ (Android) above the post.
2. Tap **Report**.
3. Follow the on-screen instructions.

Report someone through their profile


1. Tap their username from their feed, story post or from your chat with them. You can also tap and search their username to go to their profile.
2. Tap ••• (iPhone) or ⋮ (Android) in the top right of the profile.
3. Tap **Report**.
4. Follow the on-screen instructions.

ඉන්ස්ටග්‍රෑම් (Instagram) හි එයටම ආවේණික පැමිණිලි යාන්ත්‍රණයක් තිබේ. ඍබිවිටර්ප උපකාරක මධ්‍යස්ථානය යටතේ, ප්‍රචණ්ඩත්වයට හේතු වන අන්තර්ගතය හෝ පැතිකඩ වාර්තා කරන ආකාරය පිළිබඳ උපදෙස් සපයනු ලැබේ. වේදිකාව හරහා සෘජුවම වාර්තා කිරීමට ඔබට ඉන්ස්ටග්‍රෑම් (Instagram) ගිණුමක් නොමැති නම්, ඉන්ස්ටග්‍රෑම් (Instagram) උපකාරක මධ්‍යස්ථානය මගින් ඒ සඳහා ද ක්‍රියා පටිපාටියක් ඉදිරිපත් කරයි. එහිදී ඔබට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) අන්තර්ගතය පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකිය. කලින් සඳහන් කළ ආකාරයට අනාගත පැතිකඩ නිර්මාණය කළ හැකි පරිශීලකයෙකු ද ඔබට මෙහිදී අවහිර කළ හැකිය.




## 5.3.3 යූ ටියුබ් - YouTube


යූ ටියුබ් (YouTube) යනු, ගූගල් සමාගම (Google) විසින් හිමිකාරිත්වය දරණ, වීඩියෝ පදනම් කර ගත් අන්තර්ගතයන්ගේ වේදිකාවකි. එහි හිංසන (harassment) සහ සයිබර් හිරිහැර කිරීමේ (cyberbullying) ප්‍රතිපත්තිය යටතේ, "ඔවුන්ගේ ආරක්ෂිත කණ්ඩායම්වල තත්ත්වය (වයස, වාර්ගිකත්වය, සමාජභාවය සහ ප්‍රකාශනය, ලිංගික දිශානතිය ආදිය) හෝ භෞතික ලක්ෂණ ඇතුළුව ආවේණික ගුණාංග මත පදනම්ව දිගුකාලීන හෝ ද්වේෂසහගත අපහාස සහිත පුද්ගලයන් ඉලක්ක කරන අන්තර්ගතය" යූ ටියුබ් (YouTube) නොඉවසයි.




# 6 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ආරක්ෂණ යාන්ත්‍රණ

## 6.1 උන්මොචන් - Unmochon (බංග්ලාදේශය)

ගෝලීය දකුණේ කාන්තාවෝ බොහෝ විට, හිංසකයන් හෙළිදරව් කිරීමෙන් සහ හිංසාකාරී පඨිත (harassing texts) සහ දෘශ්‍ය අන්තර්ගතයේ තිර රූප (screenshots) ප්‍රසිද්ධ කිරීමෙන් තමන් ලක් වන ඔන්ලයින් හිංසන හිරිහැර සඳහා යුක්තිය සොයති. ඉන් අනතුරුව ඒවා අදාළ බලධාරීන් වෙත යොමු කෙරේ. එසේ වුවද, එවැනි සාක්ෂිවල සත්‍යතාවය බොහෝ විට අභියෝගයට ලක් වේ. 'Unmochon' නිර්මාණය කර ඇත්තේ සමාජභාවී යුක්තිය (gender justice) පිළිබඳ 'ලැජ්ජාව පදනම් කරගත් ආකෘතිය' මත ගොඩනැගෙමිනි. එය සත්‍ය සාක්ෂි ග්‍රහණය කර වින්දිතයා අරමුණු කරන කණ්ඩායම සමඟ බෙදා ගන්නා මෙවලමකි.



# 7 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වෙනස් ප්‍රභේදයන් හඳුනාගන්නේ කෙසේද?




මෙම ගැලීම් සටහන කෙනෙකුට හමුවිය හැකි විවිධ වර්ගයේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට උපකාරී වේ. මෙම සරල කළ ක්‍රමය පරිශීලකයාට ඇතැම් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වර්ග ඉවත් කිරීමට උපකාර වන අතර තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා වෙනස් වර්ගීකරණයන් තිබිය යුත්තේ මන්ද යන්න පිටුපස ඇති සූක්ෂ්මතා තේරුම් ගැනීමට ඔවුන්ට උපකාර කරයි.

## 7.1 සිදුවීම්වල අවස්ථා පදනම් කර ගනිමින් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හඳුනා ගැනීම

### 7.1.1 අනුමැතියෙන් තොර සමීප සබඳතා පින්තූර බෙදා හැරීම (Non-Consensual Intimate Image (NCII) Sharing)

සිදුවීම් අවස්ථාව: 15 හැවිරිදි ගැහැණු ළමයෙක් ඇය සමඟ ලිංගික සම්බන්ධකම් පවත්වන 16 හැවිරිදි පිරිමි ළමයෙකුට කැමැත්තෙන් තමාගේ සමීප රූප යවයි. සම්බන්ධතාවය අවසානයේ බිඳ වැටේ. මාස 3 කට පසු, ඇයගේ සමීප රූප සමහර ප්‍රාදේශීය වට්ස්ඇප් (WhatsApp) කණ්ඩායම්වල බෙදා ගන්නා බව ඇයට දැනගන්නට ලැබේ. සිය අතීත සහකරුට මුහුණ දුන් විට ඔහු ඇයට පවසන්නේ එසේ වීමට නම්, යමෙකු ඔහුගේ ජංගම දුරකථනය වෙත බලයෙන් ඇතුළු වී දත්ත ලබාගෙන (හැක් කර) පින්තූර ලබා ගෙන තිබිය යුතු  බවයි.

ප්‍රධාන හඳුනාගැනීම්:

- ගැහැණු ළමයා සිය කැමැත්තෙන් පිරිමි ළමයාට ඡායාරූප යැවූ නමුත් එම ඡායාරූප ප්‍රසිද්ධියේ බෙදා හරිනු ලබන්නේ ඇගේ අනුමැතියෙන් තොරව ය.
- ඔහුගේ දුරකථනයට අනවසරයෙන් ඇතුළුවීම සත්‍ය හෝ සත්‍ය නොවිය හැකි අතර, මෙය අනුමැතියෙන් තොරව සමීප පින්තූර (NCII) බෙදාගැනීමේ ප්‍රවර්ගය යටතට වැටේ.
- දුරකථනයක් අළුත්වැඩියා කිරීමට ලබා දුන් විට සිදුවන සාමාන්‍ය සිදුවීමක් නම්, ද්වේෂසහගත චේතනාවක් ඇති පුද්ගලයෙකු මෙවලමෙන් මකා දැමූ ඡායාරූප සහ වීඩියෝ නැවත ලබා ගැනීමට අන්ඩිලීට් (Undelete) වැනි ප්‍රතිසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි.
- දුරකථනයක් මෙවැනි තත්වයකට ලක් වූ විට සහ ක්ලවුඩ් (අයි ක්ලවුඩ් (iCloud), ගූගල් ඩ්‍රයිව් (Google Drive) මත උපස්ථ කර ඇති (backed up) සියලුම අන්තර්ගතයන් තෙවන පාර්ශවයක් අතට පැමිණි විට ද මෙයට සමාන තත්වයක් ඇති වේ.
  මෙය වළක්වා ගැනීමට ඇති හොඳම ක්‍රමය නම් අයි ක්ලවුඩ් (iCloud) හෝ ගූගල් ඩ්‍රයිව් (Google Drive) ගබඩාව සමඟ උපස්ථ කිරීමෙන් වැළකී සිටීම සහ උපාංගයකින් සමීප රූප හෝ වීඩියෝ ස්ථිරවම මකා දැමීමට අන්ඩිලීට් (Undelete) වැනි මෘදුකාංග භාවිතා කිරීමයි.

### 7.1.2 වෙනස් කළ ඡායාරූප

සිදුවීම් අවස්ථාව: කාන්තාවකට අහඹු ෆේස්බුක් ගිණුමකින් ඇයගේ ඡායාරූප වර්ණනා කරමින් ෆේස්බුක් පණිවිඩයක් ලැබේ. තමන් කලා අධ්‍යක්ෂක කෙනෙකු බව අවධාරණය කරමින් ඇයගේ සමහර ඡායාරූපවල කලාත්මක සංස්කරණයන් කිහිපයක් කළොත් කමක් නැද්දැයි එම ගිණුම ඇගෙන් විමසයි. ඇය ඒ පිළිබඳ වැඩිදුර  නොසිතා එයට එකඟ වෙයි. දින කිහිපයකට පසු, තවත් ගිණුමක් ඇයට පණිවිඩයක් යවා ඇයගේ සමීප ඡායාරූප මුදාහරින බවට තර්ජනය කරයි. මෙම දෙවන ගිණුම, වෙනස් කරන ලද ඇයගේ ඡායාරූප ඩිජිටල් අවකාශය ඔස්සේ ඇය වෙත එවමින් එම ඡායාරූප අසභ්‍ය වෙබ් අඩවියක ප්‍රසිද්ධ කර එහි සබැඳිය ඇගේ පවුලේ අයට සහ මිතුරන්ට යැවීමට කටයුතු කරන බව පවසයි.

ප්‍රධාන හඳුනාගැනීම්:

- ඡායාරූප වෙනස් කර ඇත්තේ මෘදුකාංග භාවිතයෙන් වන අතර එවැනි අවස්ථාවක, විශේෂිත මෘදුකාංගයක් භාවිතා කිරීමෙන් ඒවා වෙනස් කර ඇත්දැයි හඳුනාගත හැකිය.
- හසුරුවන ලද රූප/ පින්තූර හඳුනා ගැනීමට භාවිතා කළ හැකි නොමිලේ ලබාදෙන වෙබ්-පාදක ව්‍යෝහාරික යෙදවුම් ඇත.
- වින්දිතයෙකුට මෙම සිද්ධිය සම්බන්ධයෙන් එම අන්තර්ජාල වේදිකාවට විශේෂිත වූ ක්‍රියාමාර්ග ගත හැකි අතර වෙනස් කරන ලද පින්තූරය පිළිබඳ වාර්තාවක් ගොනු කළ හැක.

## 7.1.3 ඩොක්සින්

සිදුවීම් අවස්ථාව: S සහ V වසර 5ක ප්‍රේම සම්බන්ධයකින් පසුව වෙන් වේ. ඉන් පසුව S සමරිසි සබඳතාවක් ආරම්භ කරයි. සිය ප්‍රේමය යළි ආරම්භ කිරීමට S ගේ ඇති අකැමැත්ත නිසා කෝපයට පත් V, ව්‍යාජ සමාජ මාධ්‍ය ගිණුමක් විවෘත කරයි. V ඔහුගේ අතීත සහකාරියගේ පවුල, සේවා යෝජකයින් සහ මිතුරන් ඇතුළු සිය ගණනක් පුද්ගලයින් එම ගිණුමට එකතු කරයි. මෙම ගිණුම හරහා V විසින් S උභයරිසි (බයිසෙක්ෂුවල් - bisexual) බව හෙළි කරන අතර S ගේ පුද්ගලික සමාජ මාධ්‍ය ගිණුමේ පමණක් පෙනෙන පරිදි සමරිසි සහකරු සමග S ගේ ලිපිනයක්, දුරකථන අංක සහ පින්තූර වැනි තොරතුරු පළ කරයි. මෙයින් පසු S සහ නව සහකරු වෙත පවුලේ අය සහ මිතුරන් විසින් හිරිහැර කරනු ලබයි. ඔවුන්ගේ ලිංගිකත්වය නාඳුනන පුද්ගලයෝ දැන් අනවශ්‍ය ලිංගික අනුග්‍රහ ලබාගැනීමට උත්සාහ කරමින් සිටිති.

ප්‍රධාන හඳුනාගැනීම්:

- ලිපිනය, දුරකථන අංකය හෝ ජාතික හැඳුනුම්පත් අංකය වැනි යම් පුද්ගලයෙකු නිශ්චිත ව හඳුනාගත හැකි ඕනෑම තොරතුරක් අනුමැතියකින් තොරව මුදා හැරීම.

## 7.1.4 සෙක්ස්ටෝෂන්

සිදුවීම් අවස්ථාව: තරුණියක්, තමන් තරුණයෙකු බව කියන - අන්තර්ජාලයෙන් මුණගැසුණු පුද්ගලයෙකු සමඟ ආදර සබඳතාවක් ආරම්භ කරයි. සබැඳි සබඳතාව වර්ධනය වන අතර, වීඩියෝ ඇමතුමක සිටියදී දිනක් එම පුරුෂයා ඇයගේ ඇඳුම් කිහිපයක් ඉවත් කරන ලෙස ඉල්ලා සිටියි. මුලදී ප්‍රතික්ෂේප කළත් අවසානයේ ඇය එයට එකඟ වෙයි. ඊළඟ දිනයේ පිරිමියා, ඇයගේ උඩුකය නිරුවතින් තිර රූපයක් වීඩියෝ ඇමතුමක් හරහා යවන අතර ඇය කවදා හෝ ඔහුගෙන් වෙන් වුවහොත් එම ඡායාරූප ඇගේ දෙමාපියන්ට යවන බවට තර්ජනය කරයි. එම පුද්ගලයා මැදිවියේ පසුවන විවාහකයකු බවද අනාවරණය වේ. ඇයගේ පින්තූර මුදා නොහැරීම වෙනුවෙන් ඔහු ඇයගෙන් තවත් ලිංගික අනුග්‍රහයක් ඉල්ලා සිටියි.

ප්‍රධාන හඳුනාගැනීම්:

- යමෙකු ලිංගිකමය ස්වභාවයක පින්තූර, ලිංගික අනුග්‍රහයක් හෝ මුදල් ලබා නොදෙන්නේ නම් පුද්ගලික සහ සංවේදී අන්තර්ගතයන් බෙදා හරින බවට තර්ජනය කිරීම.

### 7.1.5 ව්‍යාජ පැතිකඩ සහ පුද්ගලානුරූඩ්ය

සිදුවීම් අවස්ථාව: කාන්තාවකගේ ව්‍යාජ පැතිකඩ දෙකක් ගැන ඇගේ මිතුරන් විසින් ඇයට අනතුරු අඟවයි. ඒවා ඇගේ ඡායාරූප භාවිතා කර සාදා ඇති අතර, එකක ඇයගේ නමට යටින් පුද්ගලික තොරතුරු ද ඇත. ඇය මෙම අන්තර්ගතයන් වාර්තා කිරීමට පුද්ගලයන් ගණනාවකගේ සහාය ලබාගන්නා අතර, අවසානයේ ගිණුම් එම වේදිකාව විසින් ඉවත් කරයි. සතියකට පසු, තවත් පැතිකඩක් දිස්වේ. ඇය එය වාර්තා කිරීමට පෙර, ගිණුම ඇයව අවහිර කරයි. ඊළඟ දවසේ, තවත් නව පැතිකඩක් නිර්මාණය වන අතර, මෙවර ඇයගේ චරිතය සහ කීර්තිය ගැන අපහාසාත්මක අදහස් පතුරුවා හරියි. ඉදිරි මාස කිහිපය තුළ එවැනි ගිණුම් 20 කට වඩා නිර්මාණය වේ. ව්‍යාජ පැතිකඩ පිළිබඳ වාර්තා කිරීම සහ ඒවා ඉවත් කිරීම තිබියදීත්, සෑම විටම ඇයව අවහිර කරමින් නව පැතිකඩ මතු වේ.

ප්‍රධාන හඳුනාගැනීම්:

- ඡායාරූපවල සිටින සැබෑ පුද්ගලයා හැර වෙනත් අයෙක් ද්වේෂසහගත චේතනාවකින් යුතුව සමාජ මාධ්‍ය වේදිකාවල පැතිකඩ නිර්මාණය කරයි.

# 8 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සඳහා ශ්‍රී ලංකාවේ නීති යාන්ත්‍රණයේ ප්‍රතිචාරය

## 8.1 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන් බලපවත්වන නීති

ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වැරදි සඳහා විශේෂයෙන් අදාළ වන නීති නොමැත. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධ නිශ්චිත නීති නොමැතිකම යනු, නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ආමන්ත්‍රණය කිරීමේදී සාමාන්‍ය දණ්ඩන වැරදි මත රඳා පැවතිය යුතු බවයි.

මෙම සාමාන්‍ය දණ්ඩන වැරදි තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සිදුවන මාධ්‍යයන් සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) නිර්වචනය කරන්නා වූ සමාජභාවයේ බලපෑම හා අන්තර්ඡේදනීය බව (intersectionality) කෙරෙහි සැලකිල්ලක් දක්වන්නේ නැත. මෙහි ප්‍රතිඵලයක් ලෙස නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ගෙන් වැඩි කොටසක් සහ අපරාධ යුක්ති පද්ධතියේ අනෙකුත් ආයතන තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි සමාජභාවීමය මූලිකාංග සහ අන්තර්ඡේදනයේ බලපෑම් පිළිබඳ සම්පූර්ණයෙන් දැනුවත් ව නැත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙකී ආයතන වින්දිතභාවය සමග දිවි ගෙවනවුන් හට ඔවුන් ලක් වූ අපරාධය විසින් ඇති කළ අතිමහත් කම්පන සහගත, සංවේදී අධි අවදානම් බව (වින්දිතයාගේ ආරක්ෂාව අවදානමට ලක් වීම ද ඇතුළත්ව) ඇගයීමට ලක් කිරීමට අපොහොසත් වෙති. මේ බව වින්දිතභාවය සමග දිවි ගෙවනවුන් වෙත ඔවුන් දක්වන ප්‍රතිචාරවලින් විදහා දැක්වේ. සමස්තයක් වශයෙන් ගත් විට, නීතිමය ප්‍රතිකර්ම සඳහා ප්‍රවේශය සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි අපරාධකරුවන්ගෙන් ආරක්ෂාව සොයන වින්දිතභාවය සමග දිවි ගෙවනවුන් හට මෙම ගැටළුවලින් බාධාවක් ඇති කරයි.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ආමන්ත්‍රණය කරන විශේෂිත නීති නොමැති විට අපරාධ යුක්තික පද්ධතිය විසින් සාමාන්‍ය අපරාධ නීතියේ ඇතැම් නීති තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ක්‍රියාවන් නීතියේ රැහැනට හසු කර ගැනීමට යොදා ගනියි. මෙම නීති ඉතා පුළුල් ලෙස අදාළ වන ඒවා ය. එසේ පුළුල් වශයෙන් අදාළ වන නීති පහත පරිදි වේ.

1) දණ්ඩ නීති සංග්‍රහයේ 285 වගන්තිය - 286අ වගන්තිය: අසභ්‍ය දේ පළ කිරීම සහ ප්‍රකාශනය
2) දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය: ලිංගික අඩන්තේට්ටම්
3) දණ්ඩ නීති සංග්‍රහයේ 372 වගන්තිය: ත්‍රාසද්ග්‍රහණය
4) දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය: පුද්ගලානුරූඪය
5) දණ්ඩ නීති සංග්‍රහයේ 483 වගන්තිය: සාපරාධී බිය ගැන්වීම
6) 1927 අංක 4 දරණ අසභ්‍ය ප්‍රකාශන පනත (සංශෝධිත)
7) 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත

## 285 වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධිත පනත)

අසභ්‍ය ප්‍රකාශන මහජනතාවට මුදා හැරීම සඳහා සිදුකරන විවිධ ක්‍රියා සම්බන්ධයෙන් මෙම විශේෂිත වගන්තිය කටයුතු කරයි. ඕනෑම අසභ්‍ය පොතක්, පත්‍රිකාවක්, කඩදාසි, චිත්‍ර, පින්තාරු කිරීම, ඡායාරූප, නිරූපණය හෝ රූපය විකිණීම හෝ කුලියට ගැනීම සඳහා විකිණීම, බෙදා හැරීම, ආනයනය කිරීම, මුද්‍රණය කිරීම තහනම් කරයි. එවැනි අසභ්‍ය ප්‍රකාශන ප්‍රදර්ශනය කිරීමෙන් සහ ඒවා විකිණීමට තැත් කිරීමෙන් දැනුවත්ව මහජනතාවට නැරඹීමට ඉඩ දීමද එම වගන්තියෙන් තහනම් වේ. මෙම වරද සඳහා දණ්ඩනය වන්නේ මාස තුනක් දක්වා දීර්ඝ කළ හැකි කාල සීමාවක් දක්වා දීර්ඝ කළ හැකි සිර දඬුවමක් හෝ දඩයක් හෝ දඩයක් සහ සිරදඬුවමක් යන දෙකම වේ.

මේ අනුව මෙම වගන්තිය 'පින්තූර පාදක කර ගත් ලිංගික අපයෝජනය' (IBSA) සඳහා අදාළ කර ගත හැකි ය. කෙසේ වෙතත්, 285 වගන්තිය අදාළ කර ගැනීම සඳහා තිබිය යුතු ප්‍රධාන සංචරකයක් නම්, මහජනතාවට ලබා දෙන ඡායාරූපය හෝ ලේඛනයේ අසභ්‍ය ස්වභාවයයි. එනිසා, නිදසුනක් වශයෙන්, මෙම වගන්තිය, මීම් එකකදී වින්දිතයාගේ මුහුණ හෝ ඇඳුමෙන් සැරසුණු සම්පූර්ණ රූපය භාවිතා කර ඇති අවස්ථාවකට අදාළ නොවේ (මීම් එකේ වචනවල අන්තර්ගතය අසභ්‍ය නම් මිස).

## දණ්ඩ නීති සංග්‍රහයේ 286 වගන්තිය - 286 අ වගන්තිය: අසභ්‍ය දේපළ කිරීම සහ ප්‍රකාශනය (සංශෝධිත)

මෙහි සන්දර්භය, අදාළ වරද 285 වගන්තියට සම්බන්ධ වන විට වේ. මෙහිදී 286 වගන්තිය මගින් පුද්ගලයෙකුට "අසභ්‍ය ප්‍රකාශනයක්" (285 වගන්තියේ හඳුනාගෙන ඇති පරිදි) විකිණීම හෝ බෙදා හැරීම හෝ මහජනයාට ලබා දීම සඳහා සන්තකයේ තබා ගැනීම තහනම් කරයි. ප්‍රකාශනය අසභ්‍ය වීම හැරුණු විට මෙහි ඇති ප්‍රධානතම අංගය නම්, එය විකිණීම, බෙදා හැරීම හෝ මහජනතාවට ලබා දීමේ අරමුණින් වැරදිකරුවා සන්තකයේ තබා ගැනීමයි.

286A වගන්තිය ළමුන්ගේ අසභ්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කටයුතු කරයි. ඡායාරූප ගැනීම, ඡායාරූප ගැනීමට උත්සාහ කිරීම සහ ළමයින්ට අදාළ අසභ්‍ය ද්‍රව්‍ය බෙදා හැරීම තහනම් කරයි.

## දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය

දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තිය මගින් ලිංගික අඩන්තේට්ටම් තහනම් කිරීම සහ සාපරාධීකරණය (අපරාධ වරදක් බවට පත් කිරීම) පහත අන්දමින් සිදු කරයි.

1) සාපරාධී බලය යෙදීම මගින් හෝ පහර දීම මගින් තැනැත්තෙකු ව ලිංගිකව අඩන්තේට්ටම්වලට ලක් කිරීම
2) වචන හෝ ක්‍රියාවන් භාවිතා කිරීම මගින් ලිංගික හිරිහැර හෝ අඩන්තේට්ටම් සිදුකිරීම

දණ්ඩ නීති සංග්‍රහයේ 333 වගන්තියෙන් හඳුනාගෙන ඇති පරිදි, ලිංගික හිරිහැරයක් හෝ කරදරයක් ඇති කරන ක්‍රියාවක්, ස්ත්‍රී දූෂණයක් නොවන ඕනෑම ක්‍රියාවක් විය හැකි බව වරද විස්තර කිරීමේදී නිශ්චිතවම සඳහන් කරයි. මෙම කොටස ඉතා බහුකාර්ය වන අතර තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පරාසයක් ආමන්ත්‍රණය කිරීමට භාවිතා කළ හැක. උදාහරණයක් වශයෙන්, සමාජ මාධ්‍ය සහ සන්නිවේදන වේදිකා හරහා වින්දිතභාවය සමග ජීවත් වන තැනැත්තාට තර්ජනය කිරීම සහ එම තැනැත්තාට අපහාස කිරීමට සහ එම තැනැත්තාගේ කීර්ති නාමය විනාශ කිරීමට අදහස් කරන මීම්ස් 345 වගන්තිය යොදාගත හැකි සමහර වැරදි අතර වේ. 2024 ජූලි මාසයේදී, "ඕනෑම ආකාරයේ සන්නිවේදනයක් මගින්ල (උදා: ලිංගිකව පැහැදිලි පණිවිඩ, රූප, ශ්‍රව්‍ය/දෘශ්‍ය වැනි විද්‍යුත් ලෙස හෝ අන්තර්ජාලය පාදක කරගෙන) සිදු කරන හිරිහැර යන්න පැහැදිලිව ඇතුළත් කරමින් 345 වන වගන්තිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා සංශෝධන පනත් කෙටුම්පතක් ගැසට් කරන ලද අතර ලිංගික හිංසන හෝ හිරිහැර ඇති කළ හැකි" වචන හෝ ක්‍රියාවන් භාවිතා කිරීමල යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳව ද පැහැදිලි කරයි.[24]

[24]Groundviews.org, 'Criminalizing Sexual Harassment: Are We Doing Enough?' (2024)<https://groundviews.org/2024/08/20/criminalizing-sexual-harassment-are-we-doing-enough/ >accessed 01 September 2025.

## දණ්ඩ නීති සංග්‍රහයේ 372 වගන්තිය

මෙම කොටස "කප්පම් ගැනීම" ලෙස සාමාන්‍යයෙන් හඳුන්වන ත්‍රාසද්ග්‍රහණය සම්බන්ධයෙන් කටයුතු කරයි. වින්දිතයාට හෝ වෙනත් පුද්ගලයෙකුට හානි කිරීමේ තර්ජනයක් යටතේ වටිනා සුරැකුමක් බවට පරිවර්තනය කළ හැකි වටිනා භාණ්ඩ හෝ ලේඛන ලබා ගැනීමේ ක්‍රියාව එය අපරාධ කරයි. මෙම වගන්තිය යොදාගැනීමේදී තිබෙන්නේ සීමිත විෂය පථයකි. කෙසේ වෙතත්, කලින් සාකච්ඡා කළ පරිදි, පුද්ගලයින් සිදුකරන්නේ ත්‍රාසද්ග්‍රහණය (කප්පම් ගැනීම) පමණක් නොවේ. ඔවුහු මූල්‍යමය වාසි ලබාගැනීම සඳහා අදාළ තැනැත්තා උවදුරේ හෙළන පින්තූර හෝ වීඩියෝ ද භාවිතා කරති. එවැනි අවස්ථාවන්හිදී මෙම වගන්තිය භාවිතා කළ හැකිය.

## දණ්ඩ නීති සංග්‍රහයේ 399 වගන්තිය

මෙම වගන්තිය මගින්, ''අනෙකෙකු ලෙස පෙනී සිටීම මගින් වංචා කිරීම'' සාපරාධීකරණය කරයි. මෙහිදී දැන දැනම වෙනත් කෙනෙකු ලෙස පෙනී සිටින, හෝ දැන දැනම තවත් අයෙකු ව නියෝජනය කරන, හෝ වෙනත් අයෙකු ව නිරූපණය කරන පුද්ගලයෙකු විසින් වෙනත් පුද්ගලයෙකු විසින් රවටා ඇති විට මෙය භාවිතා කෙරේ. සන්දර්භය සහ කරුණු අනුව ඩොක්සින් හෝ ව්‍යාජ පැතිකඩ වැනි වැරදි සඳහා මෙම කොටස භාවිතා කළ හැක.

## දණ්ඩ නීති සංග්‍රහයේ 483 වගන්තිය

සාපරාධී බිය ගැන්වීම සමග මෙම වගන්තිය කටයුතු කරයි. යමෙකුට හෝ යමෙකුගේ ඥාතියෙකුට හෝ මිතුරෙකුට හානියක් සිදුකරන අදහසින් තැති ගැන්වීමක් හෝ තර්ජනයක් සිදුකරන ක්‍රියාවක් මෙමගින් සාපරාධීකරණය කරයි. මේ අනුව වින්දිතභාවය සමග දිවි ගෙවන්නාට අපරාධකරුගේ සිතැඟිවලට නම්මා ගැනීම සිදුවිය හැකිය.

## 1927 අංක 4 දරණ අසභ්‍ය ප්‍රකාශන පනත (සංශෝධිත)

2(2) වගන්තිය මගින් පනතේ දක්වා ඇති වරද විස්තර කරයි. පුළුල් වශයෙන් එමගින් විකිණීම හෝ බෙදා හැරීම සඳහා අසභ්‍ය ප්‍රකාශන ළඟ තබාගැනීම, ආඥා පනත මගින් ම විස්තර කර ඇති ආකාරයට පුළුල් ලෙස සාපරාධීකරණය කරයි.

## 2024 අංක 9 දරන මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත

මෙම පනතේ (3(ජ) වගන්තිය) එක් අරමුණක් වන්නේ, ළමේ පනත යටතේ වූ වැරදි සිදු කිරීම සඳහා මාර්ගගත ගිණුම් සහ බොට් අවභාවිත කිරීම හඳුනාගැනීම, වැළැක්වීම සහ එයට එරෙහිව ආරක්ෂාව සැලසීම සඳහා වූ පියවර හඳුන්වා දීමල යි. පනතේ විධිවිධානවල TFSGBV පැහැදිලිවම ඇතුළත් කර නොමැති වුවද, TFSGBV ක්‍රියාවන් ලෙස අර්ථ දැක්විය හැකි සමහර විධිවිධාන අතරට 17 වන වගන්තිය (මාර්ගගත ක්‍රම ඔස්සේ සිදු කරන වංචාව), 18 වන වගන්තිය (යම් පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින් මාර්ගගත ක්‍රම ඔස්සේ සිදු කරන වංචාව) සහ 20 වන වගන්තිය (හිරිහැරයක් සිදු වීමට හේතු වන ආකාරයේ ප්‍රකාශ සන්නිවේදනය කිරීම) ඇතුළත් වේ.

## 8.2 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) පිළිබඳ පරීක්ෂණ පවත්වන ආයතන සහ අන්තර් අධිකරණ විමර්ශන සඳහා පවතින මෙවලම්

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) හි පැමිණිලි හසුරුවන අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ප්‍රධාන ආයතනය ශ්‍රී ලංකා පොලිසිය වන අතර එය නීතිය ක්‍රියාත්මක කිරීමේ සහ විමර්ශන බලතල සහිත ආයතනයයි.

### 8.2.1 පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) යනු කුමක්ද?

ශ්‍රී ලංකා පොලිසියේ සයිබර් ආශ්‍රිත අපරාධ හසුරුවන ප්‍රධාන ඒකකය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) යටතේ ස්ථාපිත පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) වේ. කෙසේ වෙතත්, මෙම ඒකකය භාවිතා කරනුයේ සංකීර්ණභාවයකින් යුතු සයිබර් අවකාශය ආශ්‍රිත ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් අපරාධකරු/නාඳුනන තැනැත්තා හෝ සැඟවී සිටින්නා විමර්ශනය කිරීමටය. පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) විසින් විශේෂිත විද්‍යුත් තැපැල් ලිපිනයක් කළමනාකරණය කරයි (මුලින් එය කළමනාකරණය කළේ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) විසිනි), එමඟින් ඔවුන්ට ෆේස්බුක් සමඟ සෘජු සම්බන්ධතා ලබා දේ. අන්තර්ගතය අවහිර කිරීම හෝ ඉවත් කිරීම අවශ්‍ය වන අවස්ථා බොහෝ විට අදාළ වෙබ් සබැඳි සමඟ පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) වෙත යොමු කළ යුතුය. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අත්සනින් පරීක්ෂණ කටයුතු පහසු කිරීම සඳහා, අධිකරණ නියෝග නොමැතිව පහත ඉල්ලීම් සහ නියෝග සිදුකළ යුතු ය.

- අ) නිශ්චිත පුද්ගලයන් හඳුනා ගැනීම සම්බන්ධ තොරතුරු සඳහා ජංගම සේවා සපයන්නන් වෙත ඉල්ලීම්.
- ආ) විදේශ ගමන් බලපත්‍රය සහ නිශ්චිත පුද්ගලයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම්.
- ඇ) නිශ්චිත පුද්ගලයන්ගේ විදේශ ගමන් තහනම් කරමින් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නියෝග නිකුත් කිරීමට ඉල්ලීම්.

### 8.2.2 ප්‍රාදේශීය පොලිස් ස්ථාන වලට තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) හි පැමිණිලි භාර ගත හැකිද?

ඔව්. සියලුම ප්‍රාදේශීය පොලිස් ස්ථාන තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (CSGBV) හෝ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සිද්ධි හැසිරවීම සඳහා ධාරිතාවයෙන් යුතු බවට සැලකේ. විශේෂයෙන්ම දුරකථන අංකය, IP ලිපිනය හෝ අපරාධකරු දන්නා අවස්ථාවලදී පොලිසිය විසින් මෙම පැමිණිලි භාර ගත යුතුය. මෙම වැරදි සම්බන්ධ පැමිණිල්ල පොලිසිය විසින් සාමාන්‍ය පැමිණිල්ලක් ලෙස සටහන් කළ යුතු අතර, පරීක්ෂණයකදී  සාමාන්‍ය ක්‍රියාමාර්ගය අනුගමනය කරනු ලැබේ. කෙසේ වෙතත්, විමර්ශනය අතරතුර, ප්‍රාදේශීය පොලිස් ස්ථානය ඔවුන්ට ඉදිරියට යාමට නොහැකි තැනකට ළඟා වුවහොත්, උදාහරණයක් ලෙස අපරාධකරු දියුණු තාක්ෂණයක් භාවිතා කරන අවස්ථාවකදී විමර්ශනය පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) වෙත යොමු කළ හැකිය.

### 8.2.3  පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට ඉටු කිරීමට කාර්ය භාරයක් තිබේ ද?

ඔව්. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) වලට ලක් වූ කාන්තාවන් සහ ගැහැණු ළමයින් එම උල්ලංඝනයන් සම්බන්ධයෙන් පැමිණිලි යොමු කරන විට ඒවා පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට සලකා බැලිය හැකිය. අපරාධකරු හඳුනාගෙන ඇති තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) පිළිබඳ පැමිණිලි හැසිරවීමටත්, විමර්ශනවලට අදාළව අධිකරණ නියෝග ලබා ගැනීමටත් මෙම ඒකක ධාරිතාවයෙන් සන්නද්ධව ඇත. කොළඹ ප්‍රධාන මූලස්ථානය වන පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයට විස්තීරණ සහ සංකීර්ණ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) වැරදි හැසිරවීමේ හැකියාව ඇත්තේ ඔවුන් සතුව විශේෂිත සයිබර් අපරාධ ඒකකයක් දැන් පවතින බැවිනි. කාර්යාංශයේ විමර්ශනවලට සහාය වීම සඳහා තොරතුරු හෙළි කරන ලෙස ඉල්ලා අධිකරණ නියෝග ලබාගෙන එය ෆේස්බුක්, ඉන්ස්ටග්‍රෑම් සහ වෙනත් සමාන සමාජ මාධ්‍ය වෙබ් අඩවි වෙත යොමු කිරීමට ද කාර්යාංශයට හැකියාව ඇත. කාන්තා හා ළමා කාර්යාංශයටද ෆේස්බුක් (Facebook) සමඟ සම්බන්ධ විය හැකි විශේෂිත විද්‍යුත් තැපෑලක් ඇති අතර එමඟින් ඔවුන් පැමිණිලි සන්නිවේදනය කරන අතර තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සිදු කරන වෙබ් අඩවි සහ පැතිකඩ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගනියි.

## 8.2.4 විමර්ශන සඳහා ජාත්‍යන්තර සහයෝගීතාව ලබා ගන්නේ කෙසේද?

පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන්, ඇමරිකා එක්සත් ජනපදයේ මෙටා (Meta) වේදිකාවන් ඔවුන්ගේ දැඩි පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණ නීති හේතුවෙන් තොරතුරු සමඟ ඉදිරියට නොපැමිණෙන බව සැලකිල්ලට ගත යුතුය. එපමණක් නොව, අන්තර්ගතය ත්‍රස්තවාදය හෝ ළමා කාමුක දර්ශන ලෙස වර්ගීකරණය කර ඇත්නම් මිස, පුද්ගලයන් පිළිබඳ තොරතුරු නිකුත් කිරීමට මෙම සමාජ මාධ්‍ය වේදිකා මෙහෙයුම් සමාගම් නීතියෙන් බැඳී නැත. එබැවින්, මෙම ආයතන ක්‍රියාත්මක වන ක්‍රියාවලිය වන්නේ අන්‍යෝන්‍ය නීති ආධාර (MLA) යෝජනා ක්‍රමයයි. කෙසේ වෙතත්, අධිකරණ අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) සහ නීතිපති දෙපාර්තමේන්තුව යන ප්‍රධාන රාජ්‍ය ආයතන හතරක සම්බන්ධීකරණය අවශ්‍ය වන බැවින් මෙය වෙහෙසකර හා කාලය ගතවන කටයුත්තකි. සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සම්බන්ධයෙන් වන විට මේවාට අමතරව තවත්  බාධාවක් තිබේ. බොහෝ සමාජ මාධ්‍ය වේදිකා ලාභ මත පදනම් වූ ආයතන බැවින් ඒවා පරිශීලකයාගේ පෞද්ගලිකත්වයට සහ නිදහසට බාධා කිරීමට කැමති නැත, එබැවින් ඇතැම් අන්තර්ගතයන් සාපරාධී වැරදි ජනනය කළ හැකි බව පෙන්වීමට පැහැදිලි තොරතුරු අවශ්‍ය වේ.

එසේ වුවද, 2006 වසරේ සිට, සයිබර් අපරාධ පිළිබඳ බුඩාපෙස්ට් සම්මුතිය ශ්‍රී ලංකාව විසින් අනුමත කරනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) වැරදිකරුවන් සහ වැරදි මාර්ග සම්බන්ධයෙන් තොරතුරු ලබා ගත හැකි යාන්ත්‍රණයක් තිබේ. මෙම සම්මුතියේ දක්වා ඇති බලාත්මක කිරීමේ යාන්ත්‍රණය හරහා මෙම සම්මුතියට අත්සන් කර ඇති රටවල නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරීන් විසින් 24/7 ක්‍රියාකාරී කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කර ඇති අතර එමඟින් ඔවුන් නීතිය ක්‍රියාත්මක කිරීමේ විමර්ශනවලට සහාය වීම සඳහා තොරතුරු හුවමාරු කර ගැනීමට සහ ලබා ගැනීමට හැකි වේ. ශ්‍රී ලංකාවේ ද පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID) විසින් කළමනාකරණය කරනු ලබන එවැනි 24/7 සම්බන්ධතා මධ්‍යස්ථානයක් ඇත, එමඟින් ජාත්‍යන්තර අධිකරණ බලයන් සම්බන්ධ වන විට සහ අනෙක් අතට තොරතුරු ඉල්ලා සිටිය හැකිය. පරිගණක අපරාධ විමර්ශන කොට්ඨාසය (CCID), මෙම වේදිකාව හරහා, සැක කටයුතු අපරාධකරු-වන්ගේ බැංකු ගිණුම් අත්හිටුවීමට, විමර්ශන සඳහා පහසුකම් සැලසීමට මෙන්ම බැංකු ගිණුමෙන් කරන ලද ගනුදෙනු ඇතුළු නිශ්චිත බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමටද ඉල්ලා සිටිය හැක.

කෙසේ වෙතත්, මේ ක්‍රමයහරහා ලබා ගන්නා වාර්තාවලට අධිකරණ ක්‍රියාදාමය තුළ කිසිදු සාක්ෂිමය වටිනාකමක් නොමැති අතර විමර්ශන කටයුතු සඳහා පමණක් ඒවා භාවිතා කළ හැකිය. අධිකරණ කටයුතු වලදී ඉදිරිපත් කළ හැකි තොරතුරු සඳහා අන්‍යෝන්‍ය නීති ආධාර (MLA) අවශ්‍ය වනු ඇත.

### 8.2.5 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සම්බන්ධයෙන් විමර්ශනය කර පියවර ගත හැකි වෙනත් රාජ්‍ය ආයතන තිබේද?

ඔව්. ළමුන් හා සම්බන්ධ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) සිදුවීම් ආමන්ත්‍රණය කිරීමේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) හි කාර්යභාරයක් ද ඇත. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) හට පුද්ගලිකව හෝ 1929 උපකාරක අංකය හරහා පැමිණිලි ඉදිරිපත් කළ හැක. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) සතුව ඔවුන්ගේම පොලිස් විමර්ශන ඒකකයක් ද ඇත. මීට අමතරව, විමර්ශන කටයුතු සඳහා තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සහ සමාජභාවීකරණය වූ ඔන්ලයින් වෛරී කථනය (GOHS) වැරදිකරුවන් සිටින ස්ථාන මෙන්ම දුරකථන අංක/IP ලිපින ලබා ගැනීම සඳහා හඳුනාගැනීමේ විස්තර, අදාළ විදුලි සංදේශ නියාමන ආයතනවලින් ඉල්ලා සිටීමට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) හි සභාපතිවරයාට බලය ඇත. එවැනි තොරතුරු වෙත ප්‍රවේශ වීමට අධිකරණ නියෝග ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය පොලිස් ස්ථාන අනුගමනය කළ යුතු ක්‍රියාවලියට සාපේක්ෂව මෙම ක්‍රියාවලිය වේගවත් හා කාර්යක්ෂම වේ. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) විසින් 2024 දී International Watch Foundation (IWF) ශ්‍රී ලංකා වාර්තාකරණ ද්වාරය පිහිටුවන ලද අතර එමඟින් නිර්නාමික සහ සරල ක්‍රියාවලියක් හරහා මාර්ගගත ළමා ලිංගික අපයෝජන පිළිබඳ වාර්තා කිරීමට පුද්ගලයින් දිරිමත් කෙරෙයි. මෙම ද්වාරය විසින් මෙවන් සිද්ධීන් වාර්තා කිරීමේ වැදගත්කම අවධාරණය කරන අතර, වින්දිතයින් තවදුරටත් හානිවලින් ගලවා ගැනීමට එවැනි ක්‍රියාමාර්ග උපකාරී වන බව සඳහන් කරයි. මේ ඔස්සේ පරිශීලකයින්ට ඉක්මනින් වාර්තා කිරීම් සිදු කළ හැකි අතර, මෙම ද්වාරය විසින් වාර්තා කරන්නාගේ නිර්නාමිකභාවය පවත්වා ගෙන යන අතරම, විද්‍යුත් තැපෑලක් ලබා ගැනීම හරහා වාර්තාවේ ප්‍රතිඵලය පිළිබඳ පසු විපරමක් සිදු කිරීමට ඉඩ සලසා දෙයි.

## 8.3 තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වින්දිතයින් පළමු ප්‍රතිචාර දක්වන්නන් ලෙස පිළිගැනීම සහ පොලිසියේ කාර්යභාරය පිළිබඳ මාර්ගෝපදේශ

වින්දිතභාවය සමග ජීවත් වන්නන් හට මුහුණ දීමට සිදු වන විවිධ ප්‍රශ්නවලට අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ආයතන සහ පාර්ශ්වකරුවන් සංවේදී වීම ඉතා වැදගත් වේ. මෙය විශේෂයෙන්ම පොලිසිය වැනි පළමු ප්‍රතිචාර දක්වන්නන් වන විට අතිශය වැදගත් වේ. වින්දිතභාවය සමග ජීවත්වන්නෝ තමන්ට සිදුව ඇති සාපරාධී වරදකට පමණක් නොව මානසික සෞඛ්‍යය, ශාරීරික ආරක්ෂාව සහ නැවත සමාජගත කිරීම සම්බන්ධ ගැටළු වැනි එකිනෙකට සම්බන්ධ ගැටළු මාලාවකට ද මුහුණ දී සිටිති. 2015 අංක 4 දරන අපරාධවලට ගොදුරු වූවන්ට සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ II කොටසේ (4 වැනි වගන්තිය) අපරාධයකට ගොදුරු වූවකු සහ/හෝ සාක්ෂිකරුවන් සමග කටයුතු කරන විට පිළිපැදිය යුතු පිරික්සුම් ලැයිස්තුවක් පොලිසියට සපයයි. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වින්දිතභාවය සමග ජීවත්වන්නන් සමඟ පොලිසිය කටයුතු කරන විට එම ලැයිස්තුවම එක හා සමාන ව අදාළ වේ.

### 8.3.1 සමාන ලෙස සැලකීම සහ අභිමානයට ගරු කිරීම

2015 අංක 4 දරන වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 3(අ) වගන්තිය විශේෂයෙන් සඳහන් කරන්නේ වින්දිතයෙකුට "සමානාත්මතාවයෙන්, සාධාරණත්වයෙන් සහ ගෞරවයට සහ පෞද්ගලිකත්වයට අදාළව සැලකීම" ඔවුන්ගේ අයිතියක් බවයි. වින්දිතභාවය සමග දිවි ගෙවන්නන්ට සෑම විටම ගෞරවයෙන් හා ගෞරවයෙන් සැලකිය යුතුය. අදාළ ආශ්‍රිත තත්වයන් තුළ ඔවුන්ට සැලකිය යුත්තේ ඔවුන්ට ආරක්ෂිත, පිළිගත් සහ සුවපහසුවක් දැනෙන ආකාරයට සහ ඔවුන් නීති පද්ධතිය කෙරෙහි විශ්වාසය තබන ආකාරයට ය. ඒ සඳහා පැමිණිල්ලක ඇති සංවේදී බව අගයමින් එම ස්ථානයේ සිටින පොලිස් නිලධාරීන්ගෙන් බැහැරව පෞද්ගලික ඉඩක් තුළ පැමිණිල්ල භාර ගැනීම සුදුසුය. පැමිණිලිකාරිය කාන්තාවක් නම්, ඇය පොලිස් ස්ථානයේ කාන්තා හා ළමා කාර්යාංශය වෙත යොමු කිරීම අත්‍යවශ්‍ය වන අතර කාන්තා පොලිස් නිලධාරිනියක් ඇයගේ ප්‍රකාශය සටහන් කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි පැමිණිල්ලක් භාර ගැනීමට සහ ඒවා විමර්ශනය කිරීමට අධිකරණ බලය ඇත. එබැවින්, පැමිණිලිකරුවන් අසාධාරණ ලෙස ආපසු හරවා නොයැවීම වැදගත් වේ. තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි වගන්තිය යටතේ, සියලුම පුද්ගලයන්ට නීතියේ සමාන ආරක්ෂාව සඳහා සමාන අයිතියක් ඇත, ඒ සඳහා ඔවුන්ගේ පැමිණිල්ල සලකා බලා විමර්ශනය කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, පොලිසියට වැඩිදුර තාක්ෂණික සහාය අවශ්‍ය වූ විට, එම කාරණය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හෝ එවැනි විශේෂිත ආයතනයකට යොමු කළ හැකිය. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) අපරාධයකට ගොදුරු වූවෙකුට, විශේෂයෙන්ම අනුමැතියෙන් තොරව බෙදා හරින පින්තූර (NCII) පාදක කර ගත් ලිංගික අඩන්තේට්ටම් සිදුව ඇති විට පොලිස් ස්ථානයට පැමිණ එම කතාව පැවසීමට විශාල ධෛර්යයක් අවශ්‍ය වේ. එබැවින්, වින්දිත භාවය සමග දිවි ගෙවන්නෙකු පොලිස් ස්ථානයට පැමිණි විට ඔවුන් ව හරවා නොගැනීම ඉතා වැදගත් වේ. වින්දිත භාවය සමග දිවි ගෙවන්නා ආපසු හැරී යාමෙන්, ඔවුන්ටනැවත පැමිණීමට හෝ වෙනත් පොලිස් ස්ථානයකට ගොස් කතාව පැවසීමට සිදුවනු ඇත. එය කම්පන සහගත මෙන්ම මූල්‍යමය වශයෙන් අභියෝගයක් ද විය හැකිය.

### 8.3.2 ළමා වින්දිතයන්ගේ උපරිම යහපත සාක්ෂාත් කිරීම

2015 අංක 4 දරණ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 3(ආ) වගන්තිය මෙසේ නියම කරයි: "වින්දිතයා ළමයෙකු වන විට, දරුවාගේ යහපත සහතික කරන ආකාරයෙන් සැලකිය යුතුය." මේ සම්බන්ධයෙන්, එක් අතකින්, සිදුවීම ගැන කතා කිරීමට දරුවාට ආරක්ෂිත සහ සුවපහසු හැඟීමක් ඇති වන පසුබිමක් ලබා දී ඇති බව සහතික කිරීම වැදගත් වන අතර අනෙක් අතට, පළමු ප්‍රතිචාර දක්වන්නා (බොහෝ විට පොලිසිය) දරුවාගේ ආරක්ෂාව සහතික කිරීමට වහාම පියවර ගත යුතුය. එබැවින් ප්‍රාදේශීය/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිවාස නිලධාරියා සහ ළමා ආරක්ෂක නිලධාරියා දැනුවත් කිරීම වඩාත් සුදුසුය. මීට අමතරව, දරුවා වයස අවුරුදු 18 ට අඩු ගැහැණු දරුවෙකු නම්, සිවිල් ඇඳුමින් සැරසී සිටින කාන්තා පොලිස් නිලධාරිනියක් පැමිණිල්ල භාර ගත යුතු අතර, දරුවා වයස අවුරුදු 18 ට අඩු පිරිමි ළමයෙකු නම්, සිවිල් ඇඳුමින් සැරසී සිටින පිරිමි නිලධාරියෙකු විසින් පැමිණිල්ල භාර ගත යුතුය. නිශ්ශබ්ද, සුවපහසු සහ පෞද්ගලික ඉඩක් ලබා දීමෙන් වින්දිතයින්ට ඔවුන්ගේ කතාව පැවසීමට සහ සවිස්තරාත්මක ප්‍රකාශයක් පටිගත කිරීමට හැකි වේ.

### 8.3.3 පක්ෂග්‍රාහී නොවන්න: වින්දිතයා සහ වින්දිතයා ව තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) වෙත භාජනය කරවූ ක්‍රියාවන් විනිශ්චය නොකරන්න

මෙය තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) අපරාධ සම්බන්ධයෙන් සියලුම අපරාධ යුක්තිය පාර්ශවකරුවන් විසින් අනුගමනය කළ යුතු අත්‍යවශ්‍ය මූලධර්මයකි. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය TFSGBV වැරදි වල සන්දර්භය අනුව, වින්දිතභාවය සමඟ දිවි ගෙවන්නාගේ "හැසිරීම" සහ බොහෝ විට අතීත සහකරුවෙකු හෝ අතීත ස්වාමිපුරුෂයෙකු වන අපරාධකරු සමඟ අන්තර්ක්‍රියා කිරීම සහ එවැනි සිදුවීම් මුලින්ම හටගත් ආකාරය ගැන විනිශ්චය කිරීම ඉතා පහසු ය. වින්දිතභාවය සමඟ දිවි ගෙවන්නන් ලැජ්ජාව සහ මානසික ව දුෂ්කර තත්වය, මානසික අවපීඩනය සහ අපරාධකරුට ඇති බිය වැනි හේතු නිසා පොලිස් ස්ථානයට පැමිණීමට පවා තමන් සමඟ ම අරගලයක් කරති. වින්දිතභාවය සමඟ දිවි ගෙවන්නා කෙරෙහි පොලිසිය පැහැදිලි පක්ෂග්‍රාහී ආකල්පයක් හෝ අවිශ්වාසයක් ප්‍රකාශ කරන්නේ නම්, එය වින්දිතභාවය සමඟ දිවි ගෙවන්නාට දැනෙනු ඇත. පසුව එම තැනැත්තා ලැජ්ජාව සහ යුක්තික පද්ධතිය ගැන විශ්වාසය නැති වී යාම හේතුවෙන් යුක්තිය පසිඳලීමෙන් ඉවත් වනු ඇත. එබැවින් එම තැනැත්තාගේ ක්‍රියාවන් පිළිබඳව කිසිදු අදහසක් ප්‍රකාශ කිරීම නොව එම කතාවට සවන් දී පරීක්ෂණ අපක්ෂපාතීව සිදු කිරීම වැදගත් වේ.

### 8.3.4 සහකම්පනයෙන් යුතු වන්න

මෙම සරල මාර්ගෝපදේශය ඉතා වැදගත් වේ. වින්දිතභාවය සමඟ දිවි ගෙවන බොහෝ අය කාංසාවෙන් පසු වෙමින් අහිමි වීමේ හැඟීමක් අත්විඳින අතර සමහර විට මානසික අවපීඩනයට පත්වේ. ඇතැමෙක් බියෙන් හා ලැජ්ජාවෙන් යුතුව බොහෝ චිත්තවේගයන් හා මානසික වේදනාවන් සමඟ පොරබදමින් සිටිති. වින්දිත දිවි ගළවාගත්තවුන්ට උපදේශනය හෝ මනෝචිකිත්සක උපකාර අවශ්‍ය වේ. පොලිසියට මෙම අවශ්‍යතා පිළිබඳ අවබෝධයක් සහ හැඟීමක් තිබීම ඉතා වැදගත් වේ. (තමන්ට හානි කර ගැනීමේ සහ අනුන්ට හානි කිරීමේ විභවයක් ද ඔවුන් තුළ තිබිය හැක) වින්දිතයාට උපදේශනය හෝ මනෝචිකිත්සක සහය අවශ්‍ය දැයි හඳුනා ගැනීමට පළමු ප්‍රතිචාර දක්වන්නන්ට හැකි විය යුතුය. අවශ්‍ය යැයි හැඟේ නම්, වින්දිතයාව දිස්ත්‍රික්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උපදේශන නිලධාරියා වෙත හෝ උපදේශන ඒකකයට හෝ ළඟම ඇති රෝහලේ මනෝ වෛද්‍ය සායනය වෙත යොමු කළ යුතු ය.

මෙයට අමතරව, 2015 අංක 4 දරන වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 3(ඉ) වගන්ති-යේ අපරාධවලට ගොදුරු වූවකුට "ඕනෑම මානසික හෝ ශාරීරික තුවාළ, හානියක්, අපරාධයක වින්දිතයෙකු ලෙස ඇති වූ පීඩාවෙන් හටගත් අශක්නුතාවයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට අයිතියක් ඇත. ."

වින්දිතභාවය සමඟ දිවි ගෙවන්නා ප්‍රකාශය ලබා දෙන විට ඉක්මන් කරමින් හෝ ප්‍රශ්න අසමින් බාධා කිරීමෙන් වැළකී සිටීම ද වැදගත් ය. ප්‍රකාශය ලබා දීමෙන් පසු පැහැදිලි කිරීම් කළ හැකිය. තවද, වින්දිතයාට තමන් කැමති භාෂාවෙන් (සිංහල හෝ දෙමළ) ප්‍රකාශය සැපයීමට ඉඩ දීම වැදගත් වේ.

## 8.3.5 අපක්ෂපාතීව සහ කඩිනමින් විමර්ශනය කරන්න: අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ

අපරාධයේ සංවේදීතාව සඳහා ඉක්මන් විමර්ශනයක් අවශ්‍ය වේ. සාක්ෂි ප්‍රවේශමෙන් එකතු කර අවශ්‍ය විටදී අංකනය කළ යුතු ය. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන් වඩාත් වැදගත් වන්නේ, ව්‍යාජ පැතිකඩවල තිර රූප, සමාජ මාධ්‍ය වේදිකා සහ විදුලි සංදේශ වේදිකා හරහා යවන පණිවිඩ, අදාළ ඡායාරූප, මීම්ස් යනාදිය ළඟ තබා ගැනීමයි. මන්ද විශේෂයෙන් පැමිණිල්ල පිළිබඳ දැනුවත් කළ පසු අපරාධකරු විසින් සාක්ෂි මකා දැමීමට ඉඩ ඇති බැවිනි. අපරාධ විමර්ශනයට අදාළ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ V කොටස තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) විමර්ශනයට මෙන්ම සාක්ෂි ආඥා පනතේ විධිවිධානවලට ද අදාළ වේ. 2015 අංක 4 දරන වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහය වීම සහ ආරක්ෂා කිරීමේ පනතේ 3(උ) වගන්තිය යටතේ අපරාධයකට ගොදුරු වූවකුට "වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කිරීමට අයිතියක් ඇත. සහ ඕනෑම පොලිස් ස්ථානයක හෝ පොලිස් දෙපාර්තමේන්තුවේ වෙනත් ඒකකයක හෝ කොට්ඨාසයක ඕනෑම නිලධාරියෙකු විසින් එවැනි ප්‍රකාශයක් සටහන් කර ගැනීම සහ අදාළ විමර්ශන අධිකාරිය විසින් එම පැමිණිල්ල අපක්ෂපාතීව සහ සවිස්තරාත්මකව විමර්ශනය කිරීම මෙයට ඇතුළත් ය.

2015 අංක 4 දරන වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ තර්ජනයට ලක්ව සිටින වින්දිතයෙකුට ආරක්ෂාව ලබා ගත හැකි විධිවිධාන පිළිබඳව ද වින්දිත භාවය සමග දිවි ගෙවන්නන් දැනුවත් කළ යුතුය.

# 9 නිගමනය

නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් ඇතුළු ප්‍රධාන ආයතන, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පැමිණිලි සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් ක්‍රියාශීලී ප්‍රවේශයක් ගනිමින් සිටියද, සීමිත සම්පත් ප්‍රතිපාදන සමඟින් ඉහළ යන පැමිණිලි සංඛ්‍යාවට විසඳුම් සෙවීම වර්ධනය වන අභියෝගයකි.

පීතෘමූලික සමාජයක ලිංගික අපරාධ පිළිබඳ ප්‍රශ්න වටා පවතින සංජානනය මෙන්ම වින්දිතයන් ලැජ්ජාවට පත් වීම වැනි හේතු නිසා වින්දිතයෝ නීතිමය පිළිසරණ පැතීමට අකමැති වෙති. මේ තත්වය මෙම සාධකය තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි පද්ධතිමය ගැටලුවක් බවට පත් කිරීමට දායක වී තිබේ. තවද, බොහෝ සයිබර් අපරාධ විවිධ අධිකරණ බලයන් සහිත වෙනස් භූමි ප්‍රදේශවල සිට ක්‍රියාත්මක වන විවිධ වේදිකා මත සිදුවීම, එකී වේදිකාවන්ට එරෙහිව විශේෂිත ක්‍රියාමාර්ග ගැනීමට විශාල බාධාවක් ව පවතියි. වඩාත් ඵලදායී ප්‍රතිචාරයක් වනු ඇත්තේ එසේ එම වේදිකාවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට හැකි වීමයි.

තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) විශේෂයෙන් අපරාධයක් බවට පත් කරන ශ්‍රී ලංකාවේ නීති නොමැතිකම නිසා ඇති වූ අඩුපාඩුව තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වැරදිකරුවන් දඬුවම් නොලබා සිටීමට හේතු වේ. මෙම තත්ත්වය අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ප්‍රමාද කිරීමට හේතු වන අතර එමඟින් යුක්තිය ප්‍රමාද වේ. මීට අමතරව, නීතිය ක්‍රියාත්මක කරන සමහර නිලධාරීන්ගේ නොහැකියාව සහ තවත් සමහරුන්ගේ පුහුණුව නොමැතිකම, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) හි වැරදිකරුවන් අධිකරණයට ගෙන ඒම සඳහා පවතින දණ්ඩ නීති භාවිතා කිරීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් අසමත් වීමට ද දැකගත හැකි ය.

පවතින සම්පත් සහ මෙවලම් සමඟින්, ඩිජිටල් වේදිකා ආරක්ෂිතව භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව පරිශීලකයා විසින් අවබෝධයක් ගොඩනඟා ගැනීම සහ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් පවතින දණ්ඩ නීති ක්‍රියාත්මක කිරීම තුළින් තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සාර්ථකව ආමන්ත්‍රණය කිරීම සහ අදාළ අත් අඩංගුවට ගැනීම් සිදුකිරීම සාර්ථක කර ගත හැකි ය.

කෙසේ වෙතත්, එය කෙටි කාලීන අවශ්‍යතාවයකි. තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) සෘජුවම ආමන්ත්‍රණය කිරීම සඳහා දිගුකාලීන සහ වර්තමාන නීතිමය ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාවය, බලාත්මක කිරීමේ නිලධාරීන් බලගැන්වීම, පුහුණු කිරීම් හරහා බලාත්මක කිරීමේ නිලධාරීන් සංවේදීකරණය සහ, හැකි නම්, තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සාකච්ඡා සමඟින් තවදුරටත් සම්පත් වෙන්කිරීමේ අවශ්‍යතාවය අප විසින් අමතක නොකළ යුතුය. බාල වයසේ පටන් පරිශීලකයින් ඉලක්ක කර ගනිමින් එසේ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සාකච්ඡාවන් ඇති කිරීම, ශ්‍රී ලංකාවේ තාක්ෂණය සමඟ බැඳි ලිංගිකත්වය හා සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (TFSGBV) ව්‍යාප්තිය වළක්වා ගැනීමට හේතු වනු ඇත.

# පරිශීලන ලැයිස්තුව


‘Gender Based Interpersonal Cyber Crime’ (UNODC 2020 පෙබරවාරි) <https://www.unodc.org/e4j/en/cybercrime/module-12/key-issues/gender-based-interpersonal-cybercrime.html> ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

චාමර එස්, ‘Unsafe outside, unsafe online’ (The Morning, 13 March 2022) <https://www.themorning.lk/unsafe-outside-unsafe-online > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

යුරෝපා කවුන්සිලය, Explanatory Report to the Council of Europe Convention on Preventing and Combatting Violence Against Women and Domestic Violence (Council of Europe Treaty Series No: 210); එක්සත් ජාතීන්ගේ මහ සභාව, ‘Discrimination and violence against individuals based on their sexual orientation and gender identity: Report of the Office of the United Nations High Commissioner for Human Rights’ UN Doc A/HRC/29/23 (2015 මැයි 04)

ඩි මෙල් එන්, පීරිස් පී සහ ගෝමස් එස්, ‘Broadening gender: Why masculinities matter?: Attitudes, practices and gender-based violence in four districts in Sri Lanka’ (කෙයා ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා, 2013).

ෆොන්සේකා ඩී, ‘The Growing Dangers of Online Sexual Exploitation of Children’ (Groundviews, 20 November 2021) <https://groundviews.org/2021/11/20/the-growing-dangers-of-online-sexual-abuse-of-children/ > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

Gender Based Interpersonal Cyber Crime’ (UNODC, 2020 පෙබරවාරි ) <https://www.unodc.org/e4j/en/cybercrime/module-12/key-issues/gender-based-interpersonal-cybercrime.html > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

Groundviews.org, 'Criminalizing Sexual Harassment: Are We Doing Enough?' (2024)<https://groundviews.org/2024/08/20/criminalizing-sexual-harassment-are-we-doing-enough/> ප්‍රවේශ දිනය 2025 සැප්තැම්බර් 01

ගුණසේකර ඩී, ‘Online gender-based violence: The new normal of sexual harassment’ (The Morning, 28 February 2021) < https://www.themorning.lk/online-gender-based-violence-the-new-normal-of-sexual-harassment/ > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

හපුආරච්චි පී, ‘Special Police Unit to crack-down on Child Pornography’ (Newsfirst, 29 July 2021) <https://www.newsfirst.lk/2021/07/29/special-police-unit-to-crack-down-on-child-pornography/ > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

කෙම්ප් එස්, 'Digital 2022: Sri Lanka' (Datareportal, 15 February 2022) <https://datareportal.com/reports/digital-2022-sri-lanka > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

කෘග් ඊ ජී යනාදීහු, (සංස්) World report on violence and health (ලෝක සෞඛ්‍ය සංවිධානය, 2002).

Population Matters, 'Sexual Harassment on Public Buses and Trains in Sri Lanka' (UNFPA Policy Brief, March 2017) < https://srilanka.unfpa.org/sites/default/files/pub-pdf/FINAL%20POLICY%20BRIEF%20-%20ENGLISH_0.pdf > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

Save the Children යනාදීහු, Online Violence Against Children in Sri Lanka (March 2022) <https://srilanka.savethechildren.net/sites/srilanka.savethechildren.net/files/Online%20Violence%20Against%20Children%20in%20Sri%20Lanka.pdf > ප්‍රවේශ දිනය 2023 මාර්තු 05.

ෂෝන්බෙක් එස්. යනාදීහු. (2021). (2021). Drawing from justice theories to support targets of online harassment. New Media & Society, 23(5), 1278–1300. https://doi.org/10.1177/1461444820913122

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය සංගමය (SLMA), Review of Research Evidence on Gender-Based Violence in Sri Lanka (2011); University Grants Commission (UGC), Center for Gender Equity and Equality & UNICEF, Prevalence of Ragging and Sexual and Gender-Based Violence in Sri Lankan State Universities (2022).

කාන්තාවන්ට එරෙහි වෙනස්කම් තුරන් කිරීමේ එක්සත් ජාතීන්ගේ කමිටුව ((CEDAW), CEDAW General Recommendation No. 19: Violence against women, 1992 <https://www.refworld.org/docid/52d920c54.html > ප්‍රවේශ දිනය 2023 ජනවාරි 27.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය, Born Free and Equal: Sexual Orientation, Gender Identity and Sex Characteristics in International Human Rights Law (දෙවන සංස්කරණය, එක්සත් ජාතීන් 2019)

වෝඩ් ජේ සහ ලැෆ්රිනියර් ජේ, Guidelines for Integrating Gender-Based Violence Interventions in Humanitarian Action: Reducing Risk, Promoting Resilience and Aiding Recovery. (අන්තර් නියෝජිතායතන ස්ථාවර කමිටුව 2015)

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය
37/2, එලිබෑන්ක් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව.
දු.ක/ෆැක්ස්: +94 11 2055404
www.cejsrilanka.org
srilanka.cej@gmail.com

/CEJ.SL | /cej_srilanka | /CEJ_SriLanka | /@CEJSriLanka

ISBN 978-624-5847-27-3